2016
ජුලි

# ශ්‍රී ලංකාවේ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන් සඳහා වගවීම සහ හානි පූරණය කිරීම

**සංවාද පත්‍රිකාව**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

## ස්තුතිය

මෙම සංවාද පත්‍රිකාව ලියන ලද්දේ භවානි ෆොන්සේකා සහ නබීලා රාජී සමග ඈන් වුඩ්වර්ත් විසිනි. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා මෙහි මුල් කෙටුම්පත කියවා තම අදහස් පළ කළේ ය. මෙම පත්‍රිකාව සාරවත් කිරීම සඳහා වටිනා අදහස් එක් කළ සහ පසු විපරම් අදහස් ලබා දුන් වින්දිතයන් කණ්ඩායම්වල සහ සිවිල් සමාජයේ නියෝජිතයන්ට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය ස්තුතිය පුද කරයි.

## හැඳින්වීම

ශ්‍රී ලංකා රජයේ හමුදා සහ ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ) සංවිධානය අතර දශක තුනක් තිස්සේ පැවති යුද්ධය අතරතුර සහ ඉන් පසුව පුළුල් ලෙස සිදු වූ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව බොහෝ වාර්තා මගින් ඉස්මතු කර දක්වා ඇත. 2009 වසරේ යුද්ධයේ අවසන් අදියර තුළ සහ යුද්ධය අවසන් වීමත් සමග ම ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා බොහෝ සෙයින් සිදු වූ බව සාක්ෂි මගින් හැඟවේ. එසේ ම ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සහ හිංසනයන් දිගින් දිගට ම සිදු වන බව වාර්තාවල දැක්වේ.[1] ගැටුම ආශ්‍රිතව මෙන් ම ගැටුමට සම්බන්ධයක් නොමැතිව ද සිදු වන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා විශාල ගැටලුවක් වී ඇත. " ළමුන් සහ කාන්තාවන්ට සිදුවන ලිංගික අපයෝජන ඉහළ යාමේ ප්‍රවණතාවක් මුළු රට පුරාම දැකිය හැකි අතර, විශේෂයෙන් මීට පෙර ගැටුම් පැවති උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ළමුන් සහ කාන්තාවන් අපයෝජනයට ලක් වීමේ සිද්ධිවල වැඩි වීමක් වාර්තා වේ."[2] මේ අතුරින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු වන්නේ ළමුන්ට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වීම් ඉහළ යාම කෙරෙහි ය.[3] සිද්ධි වාර්තා වීම වැඩි වීම මෙම වෙනසට එක් හේතුවක් විය හැකි වුවත්, අපයෝජන සිදු වීම ඉහළ යමින් පවතින අතර බොහොමයක් අපයෝජන තවමත් වාර්තා නොවන බව විශේෂඥයන්ගේ විශ්වාසයයි.[4] යුද්ධය පවතිද්දී මෙන් ම යුද්ධයෙන් පසුව අපයෝජනයට ලක් වූ වින්දිතයන් සඳහා වගවීම ප්‍රමාණවත් පරිදි සාක්ෂාත් කරගෙන නොමැති අතර, අපයෝජනයට ලක්ව දිවි ගලවාගත් අය භාවාත්මකව, ශාරීරිකව මෙන් ම ආර්ථිකමය වශයෙන් ද දිගින් දිගට ම එහි බලපෑම සමග ජීවත් වෙති.[5]

2015 ජනවාරි මස ජනාධිපති සිරිසේන මහතාගේ පාලනය ඇරඹීමත් සමඟ වෙනසක් සිදු කරන බවට ලබා දුන් පොරොන්දු තිබියදීත්, දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කළ හමුදා සහ පොලිස් නිලධාරීන්ට දඬුවම් ලබා නොදී සිටීමේ ක්‍රමය අවසන් කිරීම සඳහා රජය කිසිවක් කර නැත. පළි ගැනීමට ලක් වෙතැයි

---

[1] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්"- 2015 වසරේ ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වධහිංසාවලට ලක් වී දිවි ගලවාගත්තවුන් (International Truth and Justice Project Sri Lanka, "Silenced"-Survivors of Sexual Violence and Torture in 2015) (2016 ජනවාරි); එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය පිළිබඳව මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව, 2015 සැප්තැම්බර් 16, A/HRC/30/61, මෙතැනින් බලන්න: http://www.refworld.org/docid/55ffb1854.html [අවසන් වරට ප්‍රවේශය 2016 ජනවාරි 25]; ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "තවමත් නිමා නොවූ යුද්ධයක්: ශ්‍රී ලංකාවේ වධහිංසාවලට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වී දිවි ගලවාගත්තවුන් 2009-2015" ("A Still Unfinished War: Sri Lanka's Survivors of Torture And Sexual Violence 2009-2015") (2015 ජුලි); හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්- ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් ද්‍රවිඩ ජාතිකයන්ට එරෙහිව සිදු කළ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා (Human Rights Watch, "We will teach you a lesson" - Sexual violence against Tamils by Sri Lankan security forces) (2013 පෙබරවාරි)

[2] දිනුක් කොළඹගේ, *දුර්වල යුද නීති මධ්‍යයේ ශ්‍රී ලංකාවේ දූෂණ රැල්ල ඉහළට (Rapes Surge in Sri Lanka Amid Weak Martial laws),* අල් ජසීරා, (2014 අගෝස්තු 17), http://www.aljazeera.com/indepth/features/2014/08/rapes-surge-sri-lanka-amid-weak-marital-laws-201481772359790802.html (2012 සහ 2014 අතර කාලයේ දී රට පුරා ම ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා 20%කින් ඉහළ ගියේ ය)

[3] ෆෙයිසිල් සමාත්, *ශ්‍රී ලංකාවේ ළමා දූෂණය ඉහළට* (*Child Rape on the Rise in Sri Lanka)*, කලම්බු ටෙලිග්‍රාෆ්, (2012 ජුලි 23), https://www.colombotelegraph.com/index.php/child-rape-on-the-rise-in-sri-lanka/; මානව හිමිකම් කවුන්සිලය, මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන වාර්තාව (OISL), A/HRC/30/CRP.2 (2015 දෙසැම්බර් 1) මෙතැනින්- ¶621; ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "තවමත් නිමා නොවූ යුද්ධයක්: ශ්‍රී ලංකාවේ වධහිංසාවලට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වී දිවි ගලවාගත්තවුන් 2009-2015" *ඉහත* 1 සටහන, පිටුව 19

[4] සෞඛ්‍ය සේවා නිලධාරියෙකු සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාව, යාපනය, 2016 ජනවාරි 28; *කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඉහළට* (*Violence Against Women on the Rise)*, Irin පුවත්, (2008 නොවැම්බර් 27), http://www.irinnews.org/report/81693/sri-lanka-violence-against-women-on-the-rise

[5] හියුමන් රයිට්ස් වොච්, *ඉහත* 1 සටහන

බිය, සමාජය තුළ අතිශයින් අපකීර්තියට ලක් වීම සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා ප්‍රමාණවත් විසඳුමක් ලබා දීමට අපොහොසත් නීති පද්ධතිය පිළිබඳව ඇති අවිශ්වාසය යන හේතු නිසා ශ්‍රී ලංකාවේ වින්දිතයන් බොහෝ දෙනෙක් නිශ්ශබ්දව සිටිති. ගැටුම් ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ වින්දිතයන් බොහෝ දෙනෙකු විදේශ රටවලට පැනගොස් තිබේ. එම රටවල දී ඔවුන් තමන්ගේ කතාව පර්යේෂකයන් සමග පැවසීමෙන් පසුව පර්යේෂකයන් විසින් ඔවුන්ගේ සාක්ෂි වෛද්‍ය සහ මානසික ඇගයීම් මගින් තහවුරු කර, එම සිද්ධි ලේඛනගත කර ඇත.[6] අවස්ථා කිහිපයක දී ම හමුදා සහ පොලිස් නිලධාරීන් විසින් ද්‍රවිඩ සිවිල් වැසියන්ට මෙන් ම හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කළ බව වාර්තාවල දක්වේ.[7] ගැටුම් ආශ්‍රිත එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සාමාන්‍යයෙන් ස්ත්‍රී දූෂණය හෝ ලිංගේන්ද්‍රය පිළිස්සීම හෝ මිරිස් කුඩු ඉසීම වැනි වෙනත් භයංකර ලිංගික අපයෝජන සිදු කිරීම වැනි මුහුණුවරක් ගනී.[8] ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා නිතර ම තවත් වධ හිංසා සහ ප්‍රශ්න කිරීම් සමග එකට සිදු කරනු ලැබේ. රඳවා ගැනීමේ මධ්‍යස්ථාන, අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ කඳවුරු සහ පොලිස් ස්ථානවල දී මෙය සිදු වන අතර, කලාතුරකින් වින්දිතයන්ගේ නිවෙස් තුළ දී ද ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වූ අවස්ථා තිබේ.[9] එකිනෙකාට සම්බන්ධයක් නොමැති වින්දිතයන් එක හා සමාන වධ හිංසා අත්දැක ඇති බවට සාක්ෂි තිබීමෙන් හැඟී යන්නේ මෙම කෲර අපයෝජනයන් එකම විධිමත් සැලසුමක කොටස් බවයි.[10] වෙනත් වධ හිංසා සමග ලිංගික හිංසනයන් බොහෝ අවස්ථාවල සිදු කර ඇත්තේ අවමන් කිරීමෙන් සහ බියපත් කිරීමෙන් ද්‍රවිඩ ජනතාව පාලනය කිරීම, වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල්වල අය බිය වද්දා නිහඬ කිරීම සහ ඔවුන්ගෙන් විශාල කප්පම් ගැනීම ආදිය සඳහා බව පර්යේෂකයන් පෙන්වා දී ඇත.[11]

විධිමත් ලෙස සිදු කරනු ලබන මෙවැනි ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා මානව හිමිකම් සහ ජාත්‍යන්තර නීති උල්ලංඝනය කිරීම් වේ.[12] එම වින්දිතයන්ට සත්‍යය දැන ගැනීමට, යුක්තිය ඉටු කරවා ගැනීමට සහ වන්දි

---

[6] හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්"- *ඉහත* 1 සටහන (වින්දිතයන් 68 දෙනෙකු සහ සාක්ෂිකරුවන් බොහෝ දෙනෙකු); ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත* 1 සටහන (2015 දී සිද්ධි 20කි); ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "තවමත් නිමා නොවූ යුද්ධයක්": *ඉහත* 1 සටහන (සාක්ෂිකරුවන්ගෙන් ලබාගත් ප්‍රකාශ 180ක්, ඔවුන් සියලු දෙනා ම පාහේ ශ්‍රී ලංකාව තුළ කිසියම් කාලයක් සඳහා රැඳවුම් භාරයේ සිට ඇති අතර, නැවත නැවතත් වධ හිංසනයන්ට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වී තිබේ"); http://www.sangam.org/ANALYSIS/Lancet.htm (පිරිමින් 38 දෙනෙකි)

[7] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත* 1 සටහන; හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්"- *ඉහත* 1 සටහන; එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත 1 සටහන* 116 පිටුව

[8] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත 1 සටහන* 116 පිටුව

[9] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත* 1 සටහන; හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්"- *ඉහත* 1 සටහන; එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත* 1 සටහන 116 පිටුව https://www.hrw.org/sites/default/files/reports/srilanka0213webwcover_0.pdf

[10] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "තවමත් නිමා නොවූ යුද්ධයක්": *ඉහත* 1 සටහන

[11] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත* 1 සටහන

[12] එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, ජාත්‍යන්තර අපරාධ අධිකරණයට අදාළ රෝම ප්‍රඥප්තිය (අවසන් වරට සංශෝධනය 2010), 1998 ජූලි 17, ISBN අංකය. 92-9227-227-6, මෙතැනින් බලන්න: http://www.refworld.org/docid/3ae6b3a84.html [ප්‍රවේශය 2016 ජනවාරි 26]; එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය, 1984 දෙසැම්බර් 10, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ප්‍රඥප්ති මාලාව, වෙළුම 1465, පිටුව 85, මෙතැනින්

ඇතුළු හානි පූරණ ලබා ගැනීමට අයිතියක් ඇත.[13] එක්සත් ජාතීන්ගේ වාර්තා රැසක් මගින් පරීක්ෂණ පවත්වන ලෙස ඉල්ලා සිටීමෙන් පසුව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30 වන සැසිවාරයේ දී 'ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම' යන මැයෙන් වූ යෝජනාවක් සම්මත කර ගන්නා ලදී. ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, වින්දිතයන්ට හානි පූරණයන් ලබා දෙන ලෙසත් එමගින් රජයට බල කර සිටී.[14] අතුරුදහන් වූවන් සඳහා කාර්යාලයක්, හානි පූරණයන් ලබා දීම සඳහා කාර්යාලයක්, අධිකරණ යාන්ත්‍රණයක් සහ සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් ඇතුළු යාන්ත්‍රණ කිහිපයක් පිහිටුවීමට ශ්‍රී ලංකා රජය පොරොන්දු වී ඇත. කෙසේ වුව ද, ගැටුම් අතරතුර ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා බහුලව පැතිරී පැවති වෙනත් රටවල ප්‍රතිසන්ධානයේ දී බොහෝ අවස්ථාවල ඒවා නොසලකා හැර ඇත.[15] ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන් ද වගවීම සඳහා ප්‍රවේශයක් සහ වන්දි ලැබීම ඇතුළු සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියෙහි කොටස් කරුවන් වන බවට ශ්‍රී ලංකා රජය සිය පොරොන්දු ඉටු කිරීමේ දී වගබලා ගත යුතු ය. අධිකරණය මගින් වන්දි ලබා දීම සහ වගවීම පමණක් නොව, සත්‍යය සෙවීමේ විශ්වසනීය ක්‍රියාවලියක් සමග එක්ව සැලසුම් කර ක්‍රියාත්මක කෙරෙන තනි පුද්ගල සහ සාමූහික පුළුල් පරිපාලනමය හානි පූරණ වැඩසටහනක් විසඳුම්වලට ඇතුළත් විය යුතු ය. සංක්‍රාන්තික යුක්ති සන්දර්භය තුළ හානි පූරණය යනු "විධිමත් ලෙස ක්‍රියාත්මක කෙරුණු මානව හිමිකම් උල්ලංඝනයන් මගින් පීඩා විඳි වින්දිතයන්ට සිදු වූ හානි පිළිගෙන ඒවාට විසඳුම් ලබා දීම" සඳහා රජය විසින් ගනු ලබන පියවර වේ.[16] පරිපූර්ණ හානි පූරණ වැඩසටහනකට ඇතුළත් වන අංග වන්නේ උල්ලංඝනය සිදු වීමට පෙර තත්ත්වයට වින්දිතයන් නැවත පත් කිරීම සඳහා ප්‍රතිෂ්ඨාපනය, උල්ලංඝනය හේතුවෙන් සිදු වූ හානි සඳහා වන්දි ගෙවීම, වෛද්‍ය, මනෝ විද්‍යාත්මක හෝ වෙනත් සහය ලබා දී පුනරුත්ථාපනය කිරීම, සත්‍ය සෙවීම සහ ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීම වැනි සෑහීමකට පත් කිරීමේ පියවර සහ ආයතනික ප්‍රතිසංස්කරණ සහ අධීක්ෂණ ක්‍රමවේද ඇතුළු නැවත සිදු නොවන බවට සහතික වීම ආදිය වේ. මේවා පිළිබඳව පහත වඩාත් විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

---

බලන්නඃhttp://www.refworld.org/docid/3ae6b3a94.html [ප්‍රවේශ වූයේ 2016 ජනවාරි 26]; ප්‍රොසෙකියුටර් (රජයේ නීතිඥ) එදිරිව ඇන්ටෝ ෆුරුන්ඩ්ජා (නඩු විභාග තීන්දුව), IT-95-17/1-T, පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය, 1998 දෙසැම්බර් 10, මෙතැනින් බලන්නඃ http://www.refworld.org/docid/40276a8a4.html

[13]එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම්වලට මුහුණ දුන් වින්දිතයන්ට පිළියමක් ලබා ගැනීමට සහ හානි පූරණය සඳහා ඇති අයිතිය පිළිබඳ මූලික ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශකඃ යෝජනා සම්මතය/ මහා මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලදී, 2006 මාර්තු 21, A/RES/60/147

[14] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමඃ යෝජනා සම්මතය/ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගන්නා ලදී, 2015 ඔක්තෝම්බර් 1, A/HRC/30/L.29, මෙතැනින් බලන්නඃ http://ap.ohchr.org/documents/dpage_e.aspx?si=A/HRC/30/L.29 [අවසන් වරට ප්‍රවේශය 2016 ජනවාරි 18] ¶ 11,13,15; එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත 1 සටහන* 126 පිටුව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය, ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ මහලේකම්වරයාගේ වාර්තාව, S/2014/181

[15]රූත් රුබියෝ-මැරින්, ගැටුම් ආශ්‍රිත ලිංගික සහ ප්‍රජනනයට අදාළ ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණඃ සංවාදයක්, 19 Wm. & Mary J. Women & L. 69, 72 (2012), http://scholarship.law.wm.edu/wmjowl/vol19/iss1/5; හියුමන් රයිට්ස් වොච්, නේපාලයේ නිහඬ කර අමතක කර දැමූ ගැටුම් පැවති සමයේ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්ව දිවි ගලවාගත්තවුන් (2014), මෙතැනින් බලන්නඃ https://www.hrw.org/sites/default/files/reports/nepal0914_ForUpload_0.pdf (නේපාලයේ සිවිල් යුද්ධය පැවති සමයේ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන් අතුරු හානි පූරණ වැඩසටහන්වලට ඇතුළත් නොවී තිබුණු ආකාරය විස්තර කෙරේ)

[16] සංක්‍රාන්ති යුක්තිය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය, හානි පූරණ, (2014), මෙතැනින් බලන්න https://www.ictj.org/our-work/transitional-justice-issues/reparations

### ☛ අධිකරණමය හානි පූරණය (වන්දි ප්‍රදානය) සහ වගවීම

මානව හිමිකම් උල්ලංඝනයන් සඳහා ප්‍රතිකර්මයන් ලැබීමේ සහ හානි පූරණයන් ලැබීමේ අයිතිය ජාත්‍යන්තර නීතියෙන් පිළිගෙන ඇත.[17] අපරාධකරුවන් වැරදිකරුවන් බවට තීරණය කිරීම සහ තමන් අත්විඳි හානියට විසඳුමක් වශයෙන් එක් එක් වින්දිතයන්ට වන්දි ප්‍රදානය කිරීම මගින් වගවීම ලබා දීමට

[17] මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (8 වන වගන්තිය); සියලු ම ආකාරයේ ජාතිය මත වෙනස් කර සැළකීම් තුරන් කිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (6 වන වගන්තිය); , වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය, (14 වන වගන්තිය); බලහත්කාරයෙන් සිදු කරනු ලබන අතුරුදහන් කිරීම්වලින් සියලු දෙනාටම ආරක්ෂාව ලැබීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (24 වන වගන්තිය); ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය (68 වන වගන්තිය)

අධිකරණවලට හැකි ය.[18] සමහර විශේෂ අධිකරණ මගින් එක ම වරදකට සාමූහික සහ සදාචාරාත්මක වන්දි ද වින්දිතයන් විසින් ඉල්ලා සිටින පරිදි ප්‍රදානය කරනු ඇත.[19]

අධිකරණමය වගවීම සහ අධිකරණමය වන්දි ප්‍රදානය සඳහා ශ්‍රී ලංකාවේ බොහෝ බාධා පවතී. දණ්ඩන මුක්තිය පුළුල්ව පැතිරී තිබීම, අධිකරණ කටයුතුවල ප්‍රමාදය, පරීක්ෂණ දුර්වල තත්ත්වයක පැවතීම සහ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රමයක් නොතිබීම ඇතුළු ගැටලු ගණනාවක් නිසා ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ වින්දිතයන්හට යුක්තියට ප්‍රවේශ වීමට නොහැකි වී තිබේ.[20] 2009 වසරේ දී යුද්ධය අවසන් වී රජය විසින් ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා කිසිසේත්ම නොඉවසීමේ ප්‍රතිපත්තියක් (zero-tolerance policy)[21] අනුගමනය කළ ද, පශ්චාත් යුද සමය තුළ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා ඉහළ ගොස් ඇති අතර 2015 වසරේ දී ද එම තත්ත්වය දිගට ම පැවති බව වාර්තා මගින් පෙන්වා දෙයි.[22] මේ සම්බන්ධයෙන් පරීක්ෂණ හෝ අධිකරණමය පියවර ගෙන ඇත්නම් ඒ ඉතා සුළු වශයෙනි.

අපරාධකරුවන් බොහෝ විට සිය අනන්‍යතාව නොසඟවා, සංවිධානාත්මකව කණ්ඩායම් වශයෙන් කටයුතු කරන බව වින්දිතයෝ පවසති.[23] මෙමගින් පෙනී යන්නේ තමන්ට එරෙහිව නීති මගින් කටයුතු කරනු ලැබීම සම්බන්ධයෙන් ඔවුන්ට බියක් නොමැති බවයි.[24] කලාතුරකින් අවස්ථාවක සිද්ධියක් පිළිබඳව පැමිණිලි කර පරීක්ෂණ පවත්වා අධිචෝදනා ගොනු කරනු ලැබුවත් ඔවුන් වැරදිකරුවන් බවට තීන්දු කිරීම අසීරු ය. තව ද, බිය සහ අපකීර්තිය නිසා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හෝ පොලීසියට පැමිණිලි කිරීමට වින්දිතයන් පසුබට වූ අවස්ථා පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන ගැනීමට ලැබුණි.[25] වින්දිතයාට සහ සමහර අවස්ථාවල පවුලේ අයට සමාජයෙන් එල්ල වන අපකීර්තිය නිසා වගවීම ඉල්ලා සිටීම දිගට ම පවත්වාගෙන යාමට අකැමති බව වින්දිතයන් විසින් ම දන්වා ඇති අවස්ථා ද තිබේ.[26] එසේ ම, ප්‍රතිකාර ඉල්ලා පැමිණි අවස්ථාවල වෛද්‍ය වෘත්තිකයන් සාක්ෂි දීමට සිදු වෙතැයි බියෙන්[27]හෝ චූදිත

---

[18] රූබියෝ-මැරින්, *ඉහත* 15 සටහන 78 පිටුව

[19] සිවිල් පක්ෂ නායකත්වයක් සහිත සම-නීතිඥයන්ගේ අංශය (Civil Party Lead Co-Lawyers' Section-ECCC), 002/2 නඩුවේ අධිකරණමය හානි පූරණ පිළිබඳ මාර්ගෝපදේශ අත්පොත (Guidebook on Judicial Reparations) ECCC ඉදිරියේ විභාග වූ 002/02 නඩුව (2014 නොවැම්බර්), මෙතැනින් බලන්න http://www.eccc.gov.kh/sites/default/files/documents/courtdoc/2015-07-17%2017:01/E352.3_EN.PDF
(සාමූහික හානි පූරණයට පුනරුත්ථාපනය, ලේඛන, සහ අධ්‍යාපනය ද ඇතුළත් විය හැකි ය)

[20] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත 1 සටහන*

[21] පිළිතුරු දීමට ශ්‍රී ලංකාවට ඇති අයිතිය, මානව හිමිකම් කවුන්සිලයේ 26 වන සැසිය, න්‍යාය පත්‍ර අයිතම 4, 2014 ජූනි 23, මෙතැනින් බලන්න http://www.news.lk/news/sri-lanka/item/1325-sri-lanka-rejects-inference-that-the-presence-of-the-military-contributes-to-the-insecurity-of-women-and-girls-in-the-former-conflict-affected-areas

[22]එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය, ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය: මහ ලේකම්වරයාගේ වාර්තාව, 2015 මාර්තු 23, S/2015/203 මෙතැනින් බලන්න: http://www.refworld.org/docid/5536100a4.html [අවසන් වරට ප්‍රවේශය 2016 ජනවාරි 26]; ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත* 1 සටහන 13 පිටුව

[23] ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි. තව දුරටත් බලන්න- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන* 10 පිටුව

[24] එහිම; හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්", *ඉහත* සටහන

[25] වින්දිතයන් කණ්ඩායම් සහ සිවිල් සමාජය සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි

[26] වින්දිතයන් කණ්ඩායම් සහ සිවිල් සමාජය සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාව, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ, 2016 ජනවාරි සහ පෙබරවාරි

[27] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන* 12 පිටුව (2015 දී සිදු වූ එක් සිද්ධියක දී වින්දිතයාට මැහුම් දැමීමට සිදු වී තිබුණත් ඔහුට ප්‍රතිකාර කිරීමට කැමති වෛද්‍යවරයෙකු

වැරදිකරුවන්ගේ තර්ජන සහ ප්‍රහාරවලට බියෙන්[28] හෝ නිසි පරිදි අධිකරණ වෛද්‍ය පරීක්ෂණ (medico-legal investigations) සිදු නොකරන අවස්ථා ද ඇති බව වාර්තා වේ. මන්නාරම පොලීසියේ රාජ්‍ය විරෝධී කඩාකප්පල් කාරී ක්‍රියා මර්දනය කිරීමේ ඒකකයේ සාමාජිකයන් විසින් දූෂණයට ලක් වූ බවට පැමිණිලි කළ විජයකලා නන්දකුමාර් සහ සිවාමනි වීරකෝන්ගේ සිද්ධිය නිසි පරිදි වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමට අපොහොසත් වීම පැහැදිලි වන එක් නිදසුනකි.[29] දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාගේ මුල් වාර්තාවේ සඳහන් වූයේ දූෂණයක් සිදු වූ බවට සාක්ෂි නොමැති බවයි.[30] මහජනතාවගෙන් නැගුණු විරෝධය සහ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා කැමැත්ත ලබා නොදෙන ලෙස පොලීසිය විසින් තමන්ට තර්ජනය කළ නිසා තමන්ට වෛද්‍ය පරීක්ෂණයක් සිදු නොකළ බවට වින්දිතයන් කළ ප්‍රකාශවලින් පසුව වෛද්‍ය පරීක්ෂණයක් සිදු කරන ලදී.[31] ලිංගික අඩන්තේට්ටම්වලින් සහ වධ හිංසාවලින් තුවාල රැසක් සිදු වී ඇති බව දෙවන පරීක්ෂණයෙන් පෙනී ගියේ ය.[32] මෙවැනි බාධක නිසා ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ සිද්ධි බොහොමයක් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම නිසි පරිදි සිදු නොවන අතර, ආරක්ෂාවක් නොමැතිකම සහ පළි ගනිතැයි යන බිය නිසා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් බොහෝ අවස්ථාවල සාක්ෂි දීමට ද කැමැත්තක් දක්වන්නේ නැත.[33] එම බාධක පසුකරගෙන අධිකරණ පද්ධතිය දක්වා යන සිද්ධි එහි ගොඩගැසී වසර ගණනාවක් හෝ දශක ගණනාවක් වුව ද ප්‍රමාද වේ.[34] අධිකරණමය හානි පූරණය ඵලදායී පිළියමක් වීමට නම් දණ්ඩන මුක්තිය සහ යුක්තිය පසිඳලීම සඳහා ඇති සෙසු බාධකවලට විසඳුම් ලබා දිය යුතු ය.

### වත්මන් දේශීය නීති රාමුව

ශ්‍රී ලංකාවේ වත්මන් නෛතික රාමුව යටතේ ස්ත්‍රී දූෂණය, රැඳවුම් භාරයේ දී දූෂණය කිරීම, කණ්ඩායමක් විසින් දූෂණය කිරීම හෝ බරපතල ලිංගික අපයෝජනය වශයෙන් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව දේශීය අධිකරණවල නඩු පැවරිය හැකි ය. කාන්තාවක් රැඳවුම් භාරයේ සිටිය දී හෝ 'බිය වැද්දීමෙන්, තර්ජනයෙන් හෝ බලහත්කාරයෙන් කැමැත්ත ලබාගෙන' ලිංගික සංසර්ගයක් සිදු කිරීම ස්ත්‍රී දූෂණයට ඇතුළත් වේ.[35] රැඳවුම් භාරයේ දී දූෂණය කිරීම යනු නිල වශයෙන් රැඳවුම් භාරයේ සිටින කාන්තාවකට හෝ වැරදි ලෙස රඳවා තබාගෙන සිටින කාන්තාවකට එරෙහිව රජයේ නිලධාරියෙකු විසින් හෝ අධිකාරි බලය ඇති පුද්ගලයෙකු විසින් හෝ සිදු කරන ක්‍රියා ය.[36] ලේඛනගත වී ඇති ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා කිහිපයක් ම රැඳවුම් මධ්‍යස්ථානවල, අවතැන්වූවන්ගේ කඳවුරුවල සහ පොලිස් රැඳවුම් භාරයේ දී සිදු වී ඇති නිසා මෙම නීති ප්‍රතිපාදන විශේෂයෙන් වැදගත් වේ.[37] ස්ත්‍රී දූෂණය බවට පත් නොවන බරපතල ලිංගික

---

සොයා ගැනීම ඔහුට ඉතා අසීරු විය. වධහිංසාවලට ලක් වූ වින්දිතයන්ට ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍ය වෘත්තිකයන් අතර පැවති බිය ඒ තරම් ය.)

[28] ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි

[29] කිෂාලි පින්ටෝ ජයවර්ධන, "ශ්‍රී ලංකාවේ යුක්තිය සඳහා කාන්තාවන්ගේ ඉල්ලීම්" ("Women's demands for justice in Sri Lanka"), සන්ඩේ ටයිම්ස් (2007 දෙසැම්බර් 23), මෙතැනින් බලන්න: http://www.sundaytimes.lk/071223/Columns/focus.html

[30] *එහිම.*

[31] *එහිම.*

[32] *එහිම.*

[33] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන 9* පිටුව

[34] වරුණි කරුණාරත්න, Women Under Siege, ද සන්ඩේ ලීඩර්, (2015 සැප්තැම්බර් 20), මෙතැනින් බලන්න: http://www.thesundayleader.lk/2015/09/20/women-under-siege/

[35] ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය 363 වගන්තිය

[36] ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය 364 වගන්තිය

[37] හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්", *ඉහත සටහන 1 පිටු 30-31;* සරණාගත ලේඛන මධ්‍යස්ථානය, ද්‍රවිඩ- ශ්‍රී ලාංකික ගැටුම පැවති කාලයේ කැළෑ ප්‍රදේශ වැනි ස්ථානවල කාන්තාවන් පමණක් සිටින රැඳවුම්/ වධ කඳවුරු පැවති බවට වාර්තා (ඊපීඩීපී/ ශ්‍රී ලංකාවේ හමුදා විසින් පවත්වාගෙන ගිය "වධ

අපයෝජන දණ්ඩ නීති සංග්‍රහයේ 365 (ආ) වගන්තියෙන් ආවරණය වන අතර, ගැටුමට අදාළව ක්‍රියාත්මක කෙරෙන වෙනත් බොහෝ ආකාරවල ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා එය අදාළ වනු ඇත. වින්දිතයන්ට වන්දි ගෙවීම ද මෙම වැරදි සඳහා නියම වී ඇති දඬුවම්වලට ඇතුළත් වේ. කෙසේ වුව ද වන්දි ප්‍රදානය කිරීමේ සහ දඬුවම් නියම කිරීමේ දී විනිසුරුවරුන්ට අභිමතයක් පවතී. තව ද, ප්‍රායෝගික ගැටලු රැසක් හේතුවෙන් ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ වැරදිවලට ප්‍රමාණවත් ලෙස පිළියම් යෙදීමට දේශීය නීති රාමුව මෙතෙක් සමත් වී නැත. එනම්; විශාල වශයෙන් සිදුවන අපරාධ සම්බන්ධයෙන් අපරාධ යුක්තිය ඉටු කිරීමට හැකි අයුරින් සන්නද්ධ වී නොතිබීම, වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ විශ්වසනීය වැඩසටහනක් නොමැතිකම, ලිංගිකත්වය සම්බන්ධ ක්‍රියා වටා ඇති අපකීර්තිය සහ සංවේදීබව හේතුවෙන් සාක්ෂි ලබා ගැනීමේ දී සහ ක්‍රියාපටිපාටිමය වශයෙන් නඩු විභාගය පුරා ම ඇති වන බාධක, පරීක්ෂණ සිදු කිරීම සහ නඩු පැවරීම සම්බන්ධයෙන් වගකිව යුතු අධිකාරී බලයලත් පුද්ගලයන් තුළ ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ අගතීන් සහ පීතෘ මූලික ආකල්ප ආදියයි. මෙම ගැටලු නිසා දේශීය නීති රාමුව යටතේ වැරදිකරුවන්ට නඩු පැවරීම දුෂ්කර වී තිබේ. එසේ ම, ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට වැරදිකරුවන් වූ පුද්ගලයන් සඳහා අත්හිටවූ සිර දඬුවම් ලබා දීමේ ප්‍රවණතාවක් මෑතක සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ. ස්ත්‍රී දූෂණ නඩුවල දී අනිවාර්යය අවම සිර දඬුවමක් ලබා දීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට ලබා දුන් තීන්දුවකින් පසුව මෙම තත්ත්වය උද්ගත වී තිබේ.[38]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලෙස ද නඩු පැවරීමට හැකියාව පවතී. රැඳවුම් භාරයේ සිටිය දී පොලිස් නිලධාරීන් විසින් වධ හිංසාවට සහ දූෂණයට ලක් කරනු ලැබූ යෝගලිංගම් විජිතා විසින් එවැනි නඩුවක් පවරන ලදී.[39] අපරාධකරුවන් සහ රජය විසින් වන්දි ගෙවිය යුතු බවට අධිකරණය විසින් තීන්දු කරනු ලැබුව ද, පොලිස් නිලධාරීන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමක් සිදු වූයේ නැත.[40] 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෘෘර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත (වධහිංසා පැමිණවීමට එරෙහි සම්මුතිය පනත) යටතේ පියවර ගන්නා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය සිය මතය ඉදිරිපත් කරමින් නීතිපතිවරයාට බල කර සිටියේ ය.[41] වධහිංසා පැමිණවීමට එරෙහි සම්මුතිය පනත ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව නඩු පැවරීමට යොදගත හැකි තවත් දේශීය යාන්ත්‍රණයකි. කෙසේ වුව ද, මෙම පනත ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව පොදුවේ අපොහොසත් වී ඇති අතර, ඒ යටතේ සිදු කර ඇති පරීක්ෂණ සහ නඩු පැවරීම් ද සීමාසහිත ය.[42] සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ වැඩ පිළිවෙලක් නොමැතිකම සහ පරීක්ෂණ නිසි පරිදි සිදු නොකිරීම, සහ වෛද්‍ය පරීක්ෂණ සිදු නොවීම යන කරුණු ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව නඩු

---

කඳවුරුවල" සිටි රැඳවියන් නිතිපතා වධහිංසාවට, දූෂණයට ආදියට ලක් වී ඇත) 2 (2012 ජනවාරි 13), මෙතැනින් බලන්න: http://www.ecoi.net/file_upload/1930_1326790349_q14854-sri-lanka.pdf

[38] කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් ලෙස සැලකීම් තුරන් කිරීමේ කමිටුව වෙත ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ විකල්ප වාර්තාව (Shadow Report) (2010 ජුලි) 36, මෙතැනින් බලන්න: http://www2.ohchr.org/english/bodies/cedaw/docs/ngo/WMD_SriLanka48.pdf; රෂාන්තා එන්. ද අල්විස් සෙනෙවිරත්න, "දූෂණය: මානුෂික ගැටලුවක්", කලම්බු ටෙලිග්‍රාෆ්, (2015 ජුනි 3), මෙතැනින් බලන්න: https://www.colombotelegraph.com/index.php/rape-a-human-issue/

[39] හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්", *ඉහත සටහන 1 පිටු 18, 19; යෝගලිංගම් විජිතා එදිරිව විජේසේකර, පොලිස් උපසේවා උප පොලිස් පරීක්ෂක*, S.C. (FR) No. 186/2001, SCM 23.8.2002.

[40] හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්", *ඉහත සටහන 1 පිටු 18, 19; යෝගලිංගම් විජිතා එදිරිව විජේසේකර, පොලිස් උපසේවා උප පොලිස් පරීක්ෂක*, S.C. (FR) No. 186/2001, SCM 23.8.2002.

[41] *යෝගලිංගම් විජිතා එදිරිව විජේසේකර, අතිරේක උප පොලිස් පරීක්ෂක*, S.C. (FR) No. 186/2001, SCM 23.8.2002.

[42] ශ්‍රී ලංකාවේ වධහිංසාවට එරෙහි කමිටුවට කැනඩාවේ ලෝයර්ස් රයිට්ස් වොච් සංවිධානයෙන් ඉදිරිපත් කරන ලද කරුණු: වධහිංසාවලට එරෙහි සම්මුතියට අදාළ 3 වන සහ 4 වන ආවර්තිත වාර්තාව, (2011 ඔක්තෝම්බර්), මෙතැනින් බලන්න: http://tbinternet.ohchr.org/Treaties/CAT/Shared%20Documents/LKA/INT_CAT_NGO_LKA_47_9518_E.pdf

පැවරීම සම්බන්ධයෙන් මෙම පනත නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට සාමාන්‍යයෙන් හේතු වී තිබේ.[43] පොලීසියට දැනුම් දීමෙන් පසුව ඔවුන් විසින් පරීක්ෂණ පැවැත්වීමට අපොහොසත් වීම සහ සාක්ෂි හෝ පරීක්ෂණ කඩාකප්පල් කිරීම සිදු වූ අවස්ථා පිළිබඳව වාර්තාවල දැක්වේ.[44] මෙම පනතෙහි අරමුණ වූයේ කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීමෙන් පසුව එය ක්‍රියාවට නැංවීම වුවත්, එමගින් අදාළ අරමුණ ඉටු වී නැත. නිදසුනක් ලෙස, කෲර, අමානුෂික හෝ නින්දාසහගත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතියෙන් අමානුෂික සහ නින්දිත සැලකීම් තහනම් කරනු ලැබුව ද පනත මගින් එසේ තහනම් කිරීමට අපොහොසත් වී තිබේ.[45]

## නීතිමය රාමුව සඳහා නිර්දේශිත සංශෝධන

තනි පුද්ගලයන්ට සිදුවන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා නඩු පැවරීමේ යාන්ත්‍රණයක් දණ්ඩ නීති සංග්‍රහය මගින් ලබා දී තිබුණ ද[46], ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරනු ලබන අපරාධ ලෙස නඩු පවරන්නේ නම් වඩා හොඳ ය. මන්ද දේශීය නීති පද්ධතිය මෙන් නොව එමගින් වරදෙහි බරපතලකම සහ පරිමාණය මෙන් ම සන්නද්ධ ගැටුම් සන්දර්භයක් තුළ වින්දිතයන්ගේ අසරණකම හඳුනා ගනු ලබන අතර ම විත්තිකරුවාගේ අයිතිවාසිකම් ද ලබා දේ. ගැටුම් ආශ්‍රිතව සිදු කෙරෙන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරනු ලබන අපරාධ ලෙස නඩු පැවරිය හැකි වන පරිදි ශ්‍රී ලංකාව විසින් ජිනීවා සම්මුතීන් (Geneva Conventions) සහ ☛☛ වන අතිරේක ප්‍රොටෝකෝලයේ (Additional Protocols II) අන්තර්ගතය පිළිගෙන, රෝම ප්‍රඥප්තිය (Rome Statute) අපරානුමත කර ඒවා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි දේශීය නීති සම්මත කරගත යුතු ය. මෙම වරදෙහි බරපතලකම සහ එහි ජාත්‍යන්තර ස්වභාවය හඳුනාගෙන එමගින් වින්දිතයන්ට සිදු වන හානිය නිසි පරිදි පිළිගැනීමට දේශීය නීති පද්ධතිය අපොහොසත් වීම නිසා මෙසේ කිරීමට සිදු වී තිබේ. තව ද, මෙම අපරාධවල ස්වභාවය අනුව වින්දිතයන්ට ඵලදායී පිළියමක් ලැබෙන අයුරින් ඒවාට විසඳුම් ලබා දීමට වත්මන් දේශීය නීති රාමුවට හැකියාවක් නොමැති වන අතර; වත්මන් දේශීය නීති රාමුව මගින් ඉහළ නිලධාරීන්ගේ වගකීම (command responsibility) හඳුනා නොගැනීම නිසා එමගින් වගවීමට හානි සිදු වීම; සහ බලවත් දේශපාලන, ආරක්ෂක අංශ සහ හමුදා ක්‍රියාකාරීන්ගේ මැදිහත් වීමට සහ බලපෑමට දේශීය නීති රාමුව විවෘත වී තිබීම යන ගැටලු පවතී. ශ්‍රී ලංකාව විසින් 2006 වසරේ දී ජිනීවා සම්මුති පනත සම්මත කර ගත්ත ද, එමගින් ජිනීවා සම්මුතීන් නිසි පරිදි ක්‍රියාත්මක නොකෙරෙන බැවින් ඊට සංශෝධන අවශ්‍ය වේ. ජාත්‍යන්තර නීති දේශීය වශයෙන් සම්මත කර ගන්නා විට ගැටුම් පැවති කාලය තුළ සිදු කළ අපරාධවලට එරෙහිව නඩු පැවරිය හැකි වන පරිදි එම නීති අතීතයට බලපාන අයුරින් පැනවිය යුතු ය.[47] මේ අයුරින් ජාත්‍යන්තර නීති දේශීය වශයෙන් සම්මත කර ගැනීම සඳහා නීති ප්‍රතිසංස්කරණ අවශ්‍ය වනු ඇත.

---

[43] ජනසංසදය සහ ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය පරීක්ෂණය සහ වධහිංසාවලට අදාළ ලේඛන සකස් කිරීම පිළිබඳ සමාලෝචනය (2008 දෙසැම්බර්)

[44] මානව හිමිකම් පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ වධහිංසාව සහ නීතියක් නොමැති නීති බලාත්මක කිරීම 1 වධහිංසාවලට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට ඉදිරිපත් කළ විකල්ප වාර්තාව (shadow report) 3 (2005 නොවැම්බර්), මෙතැනින් බලන්නඃ http://www.achrweb.org/reports/srilanka/SLK-CAT0305.pdf

[45] *එහිම.*

[46] දණ්ඩ නීති සංග්‍රහය මගින් තවමත් වෛවාහක ස්ත්‍රී දූෂණයට විසඳුමක් ඉදිරිපත් නොකරන බව සිහි තබාගත යුතු ය. විවාහ වී සිටින පුද්ගලයන් අතර වුව ද දූෂණයක් සිදු වූ අවස්ථාවල එය අපරාධ වරදක් ලෙස සැලකීමට හැකි අයුරින් ව්‍යවස්ථාදායකය විසින් නීතිය සංශෝධනය කළ යුතු ය. මෙය විශේෂයෙන් ගෘහස්ථ හිංසනය ඉහළ ගොස් ඇති මෙවැනි කාලයක අවශ්‍ය සංශෝධනයකි. කෙසේ වුව ද මෙම මාතෘකාව මෙම ලේඛනයෙහි විෂයය පථයෙන් ඔබ්බෙහි පවතින්නකි.

[47] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමඃ යෝජනා සම්මතය/ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගන්නා ලදී,

ඉහත ඉස්මතු කළ පරිදි ශ්‍රී ලංකාවේ නීතිවලට ඉහළ නිලධාරීන්ගේ වගකීම (command responsibility) ඇතුළත් කළ යුතුව ඇත. ඉහළ නිලධාරීන් සහ රජයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරුණු ක්‍රියාවලට ඔවුන්ට වගකීමට සැළැස්වීමට එමගින් හැකි වේ. සිවිල් සමාජ සංවිධාන විසින් දිගින් දිගට ම මෙම නිර්දේශය සිදු කර ඇති අතර, එය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා සම්මතයේ 7 වන ඡේදයෙහි "වැඩියෙන්ම වගකිව යුත්තන්ට එරෙහිව නඩු විභාග පවත්වා දඬුවම් ලබා දීම" යනුවෙන් දක්වා ඇත.[48] රෝම ප්‍රඥප්තියෙහි 28 වන වගන්තියෙහි ඉහළ නිලධාරීන්ගේ වගකීම සඳහා ලබා දී ඇති නිර්වචනය ශ්‍රී ලංකා ව්‍යවස්ථාදයකය විසින් දේශීය නීති සඳහා ආදර්ශකයක් ලෙස භාවිත කළ හැකි ය.[49] රෝම ප්‍රඥප්තියෙහි 28 වන වගන්තියට අනුව, සිය අණ දීම යටතේ ආරක්ෂක හමුද විසින් කිසියම් අපරාධයක් සිදු කරන බව හෝ සිදු කිරීමට යන බව හමුද අණ දෙන නිලධාරියෙකු දැන සිටියේ නම් හෝ දැන සිටිය යුතුව තිබුණේ නම් සහ ඒවා සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සහ සාධාරණ පියවර ගැනීමට හෝ ඒ පිළිබඳව බලධාරීන්ට වාර්තා කිරීමට ආපොහොසත් වූයේ නම් එම අපරාධ සම්බන්ධයෙන් අදළ අණදෙන නිලධාරියා අපරාධ වරදකට වගකිව යුතු ය.[50] ඊට අමතරව 28 වන වගන්තියට අනුව, හමුද අණ දෙන නිලධාරීන් නොවන උසස් නිලධාරීන් ද සිය වගකීම සහ පාලනය යටතේ ඇති ක්‍රියාකාරකම්වලට අදළව තමන් යටතේ සිටින නිලධාරීන් විසින් කිසියම් අපරාධයක් සිදු කරන බව හෝ කිරීමට යන බව "දැන සිටියේ නම් හෝ ඒ බව පැහැදිලිව සඳහන් වන තොරතුරක් දැන දැනම නොසලකා සිටියේ නම්" සහ ඒවා සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සහ සාධාරණ පියවර ගැනීමට හෝ ඒ පිළිබඳව බලධාරීන්ට වාර්තා කිරීමට අදළ උසස් නිලධාරියා ආපොහොසත් වූයේ නම් එම අපරාධ සම්බන්ධයෙන් අපරාධ වරදකට වගකිව යුතු ය.[51] හමුදව සහ පොලීසිය විසින් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා විධිමත් ලෙසත් විශාල පරිමාණයකිනුත් සිදු කරන බවට වාර්තා වන සන්දර්භයක් තුළ ඉහළ නිලධාරීන්ගේ වගකීම (command responsibility) ශ්‍රී ලංකාවට බෙහෙවින් අදළ වේ.[52] හමුද සහ පොලිස් නිලධාරීන් වෙතින් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ වින්දිතයන් බොහෝ දෙනෙකුට අදළ අපරාධකරුවන් හඳුනා ගැනීමට නොහැකි විය හැකි බැවින් නඩු පැවරීමේ දී ද ඉහළ නිලධාරීන්ගේ වගකීම ප්‍රයෝජනවත් වේ. කෙසේ වුවද, අපරාධකරුවන් හැඳ සිටි නිල ඇඳුම් මගින් ඔවුන් අයත් වන හමුද හෝ පොලිස් අංශ හඳුනා ගැනීමට හෝ තමන් අපරාධයට ලක් වූ ස්ථානය හඳුනා ගැනීමට වින්දිතයාට බොහෝ දුරට හැකි වනු ඇත. පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය, රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය මෙන් ම සියෙරා ලියෝන් සඳහා වූ විශේෂ අධිකරයේ දී දූෂණය හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ ජාත්‍යන්තර අපරාධ සඳහා චෝදනා ලැබූ බොහෝ දෙනෙකුට එරෙහිව චෝදනා ගොනු කරනු ලැබුවේ ඉහළ නිලධාරීන්ගේ වගකීම යටතේ ය.[53]වගවීම සඳහා අනාගතයේ දී ශ්‍රී ලංකාවේ හඳුන්වා දෙන ඕනෑම

---

A/HRC/30/L.29 *ඉහත* 14 සටහන පිටුව 7 ("උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවෙන් ආවරණය වන කාල පරිච්ඡේදය ඇතුළුව, මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සහ අපචාරවලට අදළව ජාතීන්ගේ ප්‍රජාවෙන් පිළිගත් සාමාන්‍ය නීති මූලධර්ම යටතේ සම්පූර්ණ අපරාධ පෙළ සඳහා වැඩියෙන් ම වගකිව යුත්තන්ට එරෙහිව විභාග පවත්වා දඬුවම් ලබා දීමට" උනන්දු කරවනු ලැබේ)

[48] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවට අදළ ජාත්‍යන්තර නීතිය, මෙතැනින් බලන්නඃ http://www.geneva-academy.ch/RULAC/applicable_international_law.php?id_state=206

[49]එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, ජාත්‍යන්තර අපරාධ අධිකරණයට අදළ රෝම ප්‍රඥප්තිය (අවසන් වරට සංශෝධනය 2010), 1998 ජුලි 17, ISBN අංකය. 92-9227-227-6, මෙතැනින් බලන්නඃ http://www.refworld.org/docid/3ae6b3a84.html [ප්‍රවේශය 2016 ජනවාරි 26]

[50] *එහිම*

[51] *එහිම*

[52] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත* 1 සටහන; හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්", *ඉහත* 1 සටහන

[53] සාම සාධක කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුව, "පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ, රුවන්ඩාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ සහ සියෙරා ලියෝන් සඳහා වූ විශේෂ අධිකරණයේ තීන්දුවල ලිංගික ප්‍රචණ්ඩත්වයට අදළ අංග පිළිබඳව ආරක්ෂක මණ්ඩලයේ 1820 දරණ

යාන්ත්‍රණයක් මගින් මෙන් ම මේ සම්බන්ධයෙන් කටයුතු කරන සියලු දෙනාම සමහර ප්‍රදේශවල සමහර අණ දෙන නිලධාරීන් යටතේ සිදු වූ සහ සමහර විට තවමත් සිදු වෙමින් පවතින ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත.

දණ්ඩ නීති සංග්‍රහයෙහි ස්ත්‍රී දූෂණය සඳහා ඇති නිර්වචනය පිරිමි වින්දිතයන් ද ඇතුළත් වන පරිදි සංශෝධනය විය යුතු ය. යුද්ධයේ සහ පැවති ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස පිරිමින් සහ කාන්තාවන් යන දෙපිරිසම ලිංගික අපයෝජනයට ලක් වූ බව වාර්තාවල දැක්වේ.[54] සම ලිංගිකයෙකු ලෙස හංවඩු ගැසේ ය යන බිය සහ අපකීර්තිය හේතුවෙන් පිරිමි වින්දිතයෝ ලිංගික අපයෝජන පිළිබඳව පැමිණිලි කිරීමට මැළි වෙති.[55] එවැන්නන්ට අපයෝජනයක් පිළිබඳව පැමිණිලි කිරීමට උනන්දු කරවීම සහ වින්දිතයන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට ගැලපෙන අයුරින් සකස් වූ පුනරුත්ථාපන සහයක් ලබා දීම සඳහා වෙනත් පියවර ගත යුතු ය. එහෙත් පිරිමි වින්දිතයන්ට යුක්තිය ඉටු කර ගැනීම සඳහා යොමු වීමට හැකි අයුරින් අධිකරණමය යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් පියවරකි. පිරිමින් දූෂණය වීම සහ ලිංගික අපයෝජනයට ලක් වීම සිදුවිය නොහැකි දෙයක් බවත්, කිසියම් පිරිමියෙකු දූෂණයට ලක් වුවහොත් එසේ වූයේ ඔහු දුර්වලයෙකු හෝ සම ලිංගිකයෙකු නිසා බවත් ශ්‍රී ලංකාවේ බොහෝ දෙනා විශ්වාස කරති.[56] පිරිමින් දූෂණය කිරීම දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීමට අපොහොසත් වීමෙන් ද පිරිමින් දූෂණයට ලක් වීමේ හැකියාවක් නොමැති බවටත්, පිරිමින්ට එරෙහිව සිදු කෙරෙන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා අපරාධයක් නොවන බවටත් ඇති වැරදි මත තවත් තහවුරු වේ. මේ හේතුවෙන් පිරිමි වින්දිතයන් තව දුරටත් අපකීර්තියට ලක් වන අතර, ඔවුන්ට අවශ්‍ය සේවා ලබා ගැනීම සහ අධිකරණමය වගවීම ඉටු කර ගැනීම සඳහා යොමු වීම වැළකේ.

**ජාත්‍යන්තර නීතිය**

ගැටුම පැවති කාලය සහ පශ්චාත් ගැටුම් සමයට ආවේණික ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා නඩු පැවරීම ජාත්‍යන්තර නීතිය දේශීය නීති රාමුවට අන්තර්ගත කිරීමෙන් පසුව සම්පූර්ණයෙන් දේශීය අධිකරණයක දී හෝ නිශ්චිත පනතක් යටතේ විශේෂ අධිකරණයක දී හෝ දෙමුහුන් අධිකරණයක දී හෝ ජාත්‍යන්තර අධිකරණයක දී සිදු කළ හැකි ය. ඒ කුමන අධිකරණයේ නඩු පැවරුව ද එම ක්‍රියා පැහැදිලිව ම ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම් ය. ස්ත්‍රී දූෂණය සහ අනෙකුත් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා ජාත්‍යන්තර නීතිය යටතේ යුද අපරාධ (ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම්), මානව වර්ගයාට එරෙහිව සිදු කෙරෙන අපරාධ සහ වධහිංසාව යනාදි වශයෙන් නඩු පැවරිය හැකි ය. මේවා පහත විස්තරාත්මකව සාකච්ඡා කෙරේ. පහත සඳහන් අපරාධවල මූලිකාංග සම්පූර්ණ වී ඇත්දැයි තීරණය කිරීමේ දී අපරාධකරුවා ක්‍රියා කළේ ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ද යන්න අදාළ නොවන බව සිහි තබා ගැනීම වැදගත් වේ. එක් එක් ජාත්‍යන්තර ප්‍රඥප්ති තුළ මෙම අපරාධවල මූලිකාංග හඳුන්වා දී ඇති ආකාරය තරමක් වෙනස් වුව ද, ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ ඒවා සාමාන්‍යයෙන් සම්පූර්ණ වී තිබේ. මෙහි පාද සටහනෙහි දැක්වෙන මූලාශ්‍ර, රෝම ප්‍රඥප්තිය සහ පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ

---

යෝජනා සම්මතය ඇසුරින් සිදු කරනු ලබන සමාලෝචනය", මෙතැනින් බලන්න http://www.icty.org/x/file/Outreach/sv_files/DPKO_report_sexual_violence.pdf at 28

[54] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත* 1 සටහන පිටුව 116

[55] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජූනි)

[56] සන්දේශ් සිවකුමාරන්, සන්නද්ධ ගැටුම්වල දී පිරිමින්ට එරෙහිව සිදු වන ලිංගික ප්‍රචණ්ඩත්වය (Sexual Violence Against Men in Armed Conflict) The European Journal of International Law 18 වන වෙළුම අංක 2, 253, 256, (2007), මෙතැනින් බලන්න http://ejil.org/pdfs/18/2/224.pdf

අධිකරණයේ සහ රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ප්‍රඥප්ති කියවීමෙන් ජාත්‍යන්තර අපරාධවල මූලිකාංග පිළිබඳ වඩාත් පැහැදිලි කර ගත හැකිය.[57]

යුද අපරාධ: 1949 ජිනීවා ප්‍රඥප්තිවල 3 වන පොදු වගන්තිය සහ ☙☙ වන අතිරේක ප්‍රොටෝකෝලයට යටතේ ලිංගික ප්‍රචණ්ඩත්වය යුද අපරාධයකි. මෙය ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට ද අදාළ වන අතර, ගැටුම් සන්දර්භයක් තුළ "පෞද්ගලික ගෞරවය කෙළෙසන සාහසික ක්‍රියා, විශේෂයෙන් අවමන් සහගත සහ නින්දාසහගත සැලකිල්ලකට ලක් කිරීම" එමගින් තහනම් කර ඇත. දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය යුද අපරාධයක් ලෙස සැලකිය හැකි බව ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියෙන් (customary international law) ද දිගු කලක පටන් සනාථ කර තිබේ.[58] නිදසුනක් ලෙස, ස්ත්‍රී දූෂණය සහ ලිංගික අඩන්තේට්ටම් කිරීම යුද අපරාධයක් බවට කාම්බෝජියානු අධිකරණයේ අති විශේෂ අධිකරණ ශාලාවේ පූර්ව විභාග අධිකරණ ශාලාව මගින් තීන්දු කරන ලදී. එහි දී අධිකරණය විසින් උධෘත කර දක්වූයේ 1863 ලීබර් සංග්‍රහය (Lieber Code), හේග් ප්‍රඥප්තිය සහ ජිනීවා ප්‍රඥප්ති වැනි ලේඛනවල දූෂණය තහනම් කර ඇති වගන්ති ය.[59] ඊට අමතරව පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය සහ රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය මගින් ද ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා යුද අපරාධයක් ලෙස තීන්දු කර ඇත. ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා චෝදනා මත ම පමණක් පනවන ලද පළමු නඩුව වන්නේ ඇන්ටෝ ෆුරන්ඩිජාගේ නඩුවයි. ඔහු විසින් පෞද්ගලිකව දූෂණ හෝ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදු නොකළ ද, පෞද්ගලික ගෞරවය කෙළෙසන සාහසික ක්‍රියා (යුද නීති හෝ සිරිත් උල්ලංඝනය) සඳහා ආධාර සහ අනුබල දීම සඳහා ඔහු වැරදිකරුවෙකු බව අධිකරණය විසින් තීන්දු කරන ලදී.[60] එසේ ම, ප්‍රොසෙකියුටර් (රජයේ නීතිඥ) එදිරිව අකයේසු (*Prosecutor vs Akayesu*) නඩුවේ දී පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදු නොකළ ද ඔහු එම ක්‍රියා සිදුවන බව දන සිටි අතර ඒවාට ආධාර සහ අනුබල දී තිබුණි. සාක්ෂිවල වැඩි වශයෙන් අඩංගු වී තිබුණේ දූෂණය කිරීම සඳහා කාන්තාවන් ඇදගෙන යන අයුරු අකයේසු බලා සිටි බවත්, එක් අවස්ථාවක කාන්තාවක ඉවතට රැගෙන යන ලෙස අණ දී "ඔක්කොටම කලින් මේ කෙල්ල එක්ක නිදගන්න අමතක කරන්න එපා" යනුවෙන් පැවසූ බවත් සඳහන් වන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශයි.[61] සිදු වූ දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා බොහොමයක් නගරයේ ප්‍රසිද්ධියේ සිදු වීම ද වැරදිකරු ලෙස

---

[57] අපරාධයේ මූලිකාංග, මෙතැනින් බලන්න: https://www.icc-cpi.int/NR/rdonlyres/336923D8-A6AD-40EC-AD7B-45BF9DE73D56/0/ElementsOfCrimesEng.pdf (රෝම ප්‍රඥප්තිය යටතේ යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහිව සිදුකරනු ලබන අපරාධවල මූලිකාංග පැහැදිලි කරයි.); පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ යාවත්කාලීන කළ ප්‍රඥප්තිය, මෙතැනින් බලන්න http://www.icty.org/x/file/Legal%20Library/Statute/statute_sept09_en.pdf; රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ප්‍රඥප්තිය, මෙතැනින් බලන්න: http://www.icls.de/dokumente/ictr_statute.pdf

[58] මානව හිමිකම් මධ්‍යස්ථානය කැලිෆෝනියා සරසවියේ බර්ක්ලී නීති විද්‍යාලයේ (Berkeley School of Law) අධිකරණ සහායකගේ නඩු ගොනුව, ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරනු ලබන අපරාධ, යුද අපරධ, සහ වධහිංසාව ලෙස සැලකීම, අතිවිශේෂ අප්‍රිකානු අධිකරණ ශාලාවට ගොනු කිරීම, 13-15 (2015 දෙසැම්බර්)

[59] නඩු අංක 002, නඩු ගොනු අංක 002/19-09-2007-ECCC/OCIJ (PTC 145 & 146), පූර්ව විභාග අධිකරණය, එම තීන්දුවට එරෙහිව අභියාචනයේ දී නුවොන් චියා සහ යෙන්ග් තිරිත් විසින් දෙනු ලැබූ තීන්දුව, 2011 පෙබරවාරි 15, 151 ඡේදය.

[60] ප්‍රොසෙකියුටර් (රජයේ නීතිඥ) එදිරිව ඇන්ටෝ ෆුරුන්ඩිජා (නඩු විභාග තීන්දුව), IT-95-17/1-T, පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය, 1998 දෙසැම්බර් 10; වැඩි දුරටත් බලන්න අකයේසු, රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය 96-4-T, තීන්දුව පිටුව 686 (ලිංගික ප්‍රචණ්ඩත්වය ප්‍රඥප්තියේ යුද අපරාධ සම්බන්ධ වගන්තිවල "පෞද්ගලික ගෞරවයට අවනම්බු කිරීම" යන "අර්ථය තුළ පවතින බව" සැලකිය යුතු ය. (සුදුසු මූලිකාංග සම්පූර්ණ කර ඇති අවස්ථාවල දූෂණය වර්ග ඝාතනය යටතට ද අයත්විය හැකි බව ෆුරුන්ඩිජා සහ අකයේසු නඩුවල දී අධිකරණ දෙකම ප්‍රකාශ කළ බව සැලකිය යුතු ය.)

[61] සාම සාධක කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුව, *ඉහත* 53 සටහන

තීන්දු කිරීමට පහසුවක් විය.[62] ශ්‍රී ලංකා සන්දර්භය තුළ මෙලෙස ප්‍රසිද්ධියේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීම පුළුල් ලෙස සිදු වී නොමැත. එහෙත් අනෙක් අය කැළයකට ඇදගෙන යනු අභ්‍යන්තරව අවතැන් වූවන් සහ රැඳවියන් දුටු බවට සහ "කරදර නොකරන්නැයි කළ ආයාචනා" සහ විලාප දෙන අයුරු ඔවුන්ට ඇසුණු බවට සාක්ෂි තිබේ.[63] යම් යම් ස්ථානවල ප්‍රචණ්ඩ ක්‍රියා පුළුල් ලෙස සිදු වූ බව පෙන්වීමට මෙන් ම එම ස්ථාන සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් වගවීමට ලක් කිරීමට එවැනි සාක්ෂි ද එක් දත්තයක් වශයෙන් යොදා ගත හැකි ය.

**මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධ**: ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ ද දූෂණය මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධයක් ලෙස මනාව තහවුරු වී තිබේ.[64] ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තියේ මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධ සඳහා දී ඇති නිර්වචනයට "දූෂණය, ලිංගික වහල්භාවය, බලහත්කාරයෙන් ගණිකා වෘත්තියෙහි යෙදවීම, බලහත්කාරයෙන් ගැබ් ගැන්වීම, බලහත්කාරයෙන් වන්ධ්‍යකරණයට ලක් කිරීම, හෝ සන්සන්දනාත්මකව බරපතල වෙනත් ඕනෑම ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවක්" ඇතුළු "කිසියම් සිවිල් ජනගහණයකට එරෙහිව ප්‍රහාරයක් බව දන දනම පුළුල්ව පැතිරී ගිය සහ විධිමත් අයුරින් සිදු කරන ප්‍රහාරවල කොටසක් ලෙස සිදු කරනු ලබන" විවිධාකාරයේ ක්‍රියාවන් ඇතුළත් වේ.[65] එවැනි අපරාධ යටතේ නඩු පැවරීම සඳහා කිසියම් ප්‍රහාරයක "පුළුල්ව පැතිරී ගිය" බව සහ "විධිමත්" බව වැනි ප්‍රධාන මූලිකාංග පැවති බව ඔප්පු කළ යුතු ය. එම මූලිකාංග සඳහා නිශ්චිත නිර්වචන එම ප්‍රඥප්තියෙහි සහ ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියේ ද සඳහන් වේ. "පුළුල්ව පැතිරී ගිය" යන්නට "ප්‍රහාරයේ විශාල පරිමාණය සහ වින්දිතයන්ගේ සංඛ්‍යාව" ඇතුළත් වන බවට තීන්දු කර ඇති අතර[66], "විධිමත්" යන්න "ප්‍රචණ්ඩ ක්‍රියාවල ඇති සංවිධානාත්මක ස්වභාවය සහ එවැනි දෙයක් අහඹු ලෙස සිදු වීමේ හැකියාවක් නොමැතිකම" යනුවෙන් තීන්දු කර ඇත [67]. ශ්‍රී ලංකාව රෝම ප්‍රඥප්තියට අත්සන් තබා නැතත් රටේ විධිමත් ලෙස සිදු වන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධයක් ලෙස නඩු පැවරිය හැකි ය. දූෂණය මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධයක් ලෙස මුලින් ම ප්‍රකාශයට පත් කරන ලද්දේ 1919 පළමු ලෝක යුද්ධයේ දී සිදු වූ අපරාධ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත් කළ කොමිෂන් සභාව විසිනි.[68] එතැන් පටන් දිගට ම අධිකරණ සහ ව්‍යවස්ථාදයක විසින් දූෂණය මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධයක් ලෙස හඳුනා ගනු ලැබිණි.[69] පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණ ප්‍රඥප්තියේ මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධ ආවරණය වන 5 වන වගන්තිය මගින් මේ අයුරින් පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයට බලය

---

[62] *එහිම*

[63] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත* 1 සටහන පිටුව 120

[64] අධිකරණ සහායකගේ නඩු ගොනුව, *ඉහත* 58 සටහන 17-19 පිටු

[65] https://www.icc-cpi.int/nr/rdonlyres/ea9aeff7-5752-4f84-be94-0a655eb30e16/0/rome_statute_english.pdf

[66] *ප්‍රොසෙකියුටර් එදිරිව නහිමානා බරායග්විසා සහ නිගීස් (Prosecutor v Nahimana, Barayagwiza and Ngeze)*

[67] *නලේටිලික් සහ මාර්ටිනෝවික් (Naletilic and Martinovic)*, (නඩු විභාග අධිකරණය), 2003 මාර්තු 31, 236 ඡේදය

[68] යුද්ධයට වගකිව යුත්තන්ගේ වගකීම් සහ දඬුවම් පැනවීම පිළිබඳව කොමිෂන් සභාව විසින් මූලික සාම සමුළුවට ඉදිරිපත් කළ වාර්තාව (Carnegie Endowment for International Peace, Division of International Law Pamphlet No 3, 1919), නැවත මුද්‍රණය 14 American Journal of International Law 95 (1920), පිටු 114, 127 (මනුෂ්‍ය වර්ගයාගේ නීති (laws of humanity) උල්ලංඝනය කිරීම් ලැයිස්තුවකට දූෂණය අන්තර්ගත කර ඇත)

[69] කුනාරක් සහ තවත් අය (IT-96-23 & 23/1) (this was the first case in the පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ දී දූෂණය මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස තීරණය කොට වැරදිකරුවෙකු බවට තීන්දු කළ පළමු නඩුව මෙයයි); තකෂි සකායිගේ නඩු විභාගය එක්සත් ජාතීන්ගේ යුද අපරාධ කොමිෂන් සභාව, Law Report of Trials of War Criminals Vol. XIV, නඩු අංක. 83, චීන යුද අපරාධ ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යංශයේ හමුදා අධිකණය, නැන්කින්ග්, 1946 අගෝස්තු 29 (1949) පිටුව 7

ලබා දී ඇතः එනම්; "ජාත්‍යන්තර හෝ අභ්‍යන්තර ස්වභාවයේ සන්නද්ධ ගැටුම්වල දී ඕනෑ ම සිවිල් ජනගහණයක් ඉලක්ක කරගෙන සිදු කෙරෙන පහත සඳහන් අපරාධවලට වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමේ බලය එම අධිකරණයට හිමි වේः (අ) මනුෂ්‍ය ඝාතනය; [...] (ඊ) වධ හිංසාව; (උ) දූෂණය; (ඌ) දේශපාලනික, ජාතිකත්ව හෝ ආගමික පදනම මත වධ හිංසා පැමිණවීම; (එ) වෙනත් අමානුෂික ක්‍රියා."[70] රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ද මීට සමාන වුවත් ඒ යටතේ සන්නද්ධ ගැටුමක් පැවතීම අවශ්‍ය නොවන අතර, සිවිල් වැසියන් කෙරෙහි එල්ල වන පුළුල්ව පැතිරී ගිය සහ විධිමත් ප්‍රහාර "ජාතික, දේශපාලනික, ජනවාර්ගික, හෝ ආගමික පදනම් මත සිදු විය යුතු බව" එහි දැක්වේ.[71] පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ පැවති *කුනාරක් සහ තවත් අය* නඩුවේ දී මෙය විස්තරාත්මකව පැහැදිලි වේ. එහි දී බොස්නියාවේ දූෂණ කඳවුරු නිර්මාණය කිරීම සඳහා සහභාගි වූ තිදෙනා ම මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරන ලද අපරාධයක් ලෙස දූෂණය කිරීමේ වරදට වැරදිකරුවන් ලෙස තීන්දු විය. "සිවිල් වැසියන්ට එරෙහිව පුළුල්ව පැතිරී ගිය සහ විධිමත් ප්‍රහාර එල්ල වන සන්දර්භයක් තුළ" [72] "මුස්ලිම්වරුන් අභිබවා තමන්ගේ උසස් බව සහ ජයග්‍රහණය තහවුරු කර ගැනීම" සඳහා සර්බිවරුන්ට දූෂණය මගින් හැකි වූ බව අධිකරණය තීන්දු කළේ ය. ශ්‍රී ලංකාවේ ගැටුම ආශ්‍රිතව සිදු කළ දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා මගින් සිවිල් වැසියන් ඉලක්ක කළ බව ප්‍රසිද්ධියට පත් වී ඇති වාර්තාවලින් පෙනී යයි. එසේ ම, ලිංගික ප්‍රචණ්ඩත්ව සිද්ධි හුදෙකලා ක්‍රියාවන් නොව එක හා සමාන මෙවලම් භාවිත කරමින් එක හා සමාන රටාවකට සිදු කළ, හිතාමතාම වධහිංසාවට ලක් කිරීමේ ප්‍රතිපත්තියක කොටසක් බව ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වී දිවි ගලවාගත් වින්දිතයන්ගේ සාක්ෂිවල සඳහන් වීමෙන් මෙම ක්‍රියාවල පුළුල්ව පැතිරී ගිය සහ විධිමත් ස්වභාවය පැහැදිලිව පෙනේ. තව ද එමගින් ද්‍රවිඩ ජනතාවට සිදු වී ඇති විෂම බලපෑම සහ අපරාධකරුවන් විසින් "දෙමළ බල්ලෝ" වැනි අපහාසාත්මක යෙදුම් යොදා ගත් බවට පළවන වාර්තා හේතුවෙන් මෙම අපරාධ දේශපාලනික, ජනවාර්ගික සහ ආගමික පදනම් මත සිදු වූ බව තහවුරු වේ.[73] ජාත්‍යන්තර නීතිය යටතේ මනුෂ්‍ය වර්ගයාට එරෙහිව සිදු කරනු ලබන අපරාධයක් ලෙස දූෂණයේ මූලිකාංග සම්පූර්ණ වන බව ප්‍රසිද්ධියට පත් වී ඇති තොරතුරු පදනම් කරගෙන කිව හැකි ය.

වධහිංසා පැමිණවීමः අවසන් වශයෙන් දූෂණය සහ වෙනත් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා වධ හිංසාව යන අපරාධයට ද අයත් වේ. වධහිංසා පැමිණවීම සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය ශ්‍රී ලංකාව අපරානුමත කර ඇති අතර එය 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත යනුවෙන් දේශීය නීතියට ද ඇතුළත් කරගෙන තිබේ.[74] මෙම පනතෙහි වධහිංසා පැමිණවීම නිර්වචනය කර ඇත්තේ මෙසේ යः වෙනත් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූ ද, එම තැනැත්තාගෙන් යම් තොරතුරක් හෝ පාපොච්ඡාරණයක් ලබා ගැනීම, එකී තැනැත්තාට දඬුවම් කිරීම, එම තැනැත්තා බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා හෝ වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූ ද නිල තත්ත්වයකින් කටයුතු කරන තැනැත්තෙකු විසින් හෝ එම තැනැත්තාගේ මුල්වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූ යම් ක්‍රියාවකි.[75] ශ්‍රී ලංකාවේ සිදුවන ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා පැහැදිලිව ම මෙම නිර්වචනයට

---

[70] සාම සාධක කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුව, *ඉහත* 53 සටහන

[71] *එහිම*

[72] පැවති යුගොස්ලාවියාව සඳහා වූ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය, "ප්‍රමුඛ නඩු තීන්දු", මෙතැනින් බලන්න http://www.icty.org/en/in-focus/crimes-sexual-violence/landmark-cases

[73] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන*; හියුමන් රයිට්ස් වොච්, "අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්", *ඉහත සටහන 1;* එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත* 1 සටහන පිටුව 67

[74] 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත

[75] *එහිම*

ගැලපේ. වධහිංසා පැමිණවීම මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරනු ලබන අපරාධයක් ලෙසත්, යුද අපරාධයක් ලෙසත්, එනයින් ම ජාත්‍යන්තර සිරිත් නීතිය යටතේ අපරාධයක් ලෙසත් සැලකේ.[76] පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය මෙන් ම, රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය මගින් ද දූෂණය වධහිංසා පැමිණවීමක් ලෙස නඩු පවරා ඇත.[77] ශ්‍රී ලංකාවේ ගැටුම ආශ්‍රිතව සිදු කරනු ලබන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා බොහොමයක් වධහිංසා පැමිණවීමක් ලෙස සැලසුම් කර එම අරමුණින් යුතුව සිදු කරන බව පෙනී යයි.[78] සිගරට් කොටවලින් පියයුරු පිළිස්සීම හෝ ශිෂ්ණයට ඉඳිකටු ඇතුළු කිරීම වැනි ලිංගික ස්වභාවයේ වධදීම් පිළිබඳව වින්දිතයන් නිතරම වාර්තා කර ඇත. එසේ ම ප්‍රචණ්ඩත්වය නිතර ම සිදු වන්නේ නිරුවත් කිරීම සහ අපහාසාත්මක වචන කීම වැනි නින්දිත ආකාරයේ සැලකීම් ද සමග ය.[79] එවැනි නින්ද කිරීම් සිදු කරන්නේ වධහිංසා පැමිණවීම ඉලක්ක කරගෙන බව විශේෂයෙන් පැහැදිලි වේ.[80]

**අධිකරණය**

හොඳ ම ක්‍රමය වන්නේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ගැටුම ආශ්‍රිත මානව හිමිකම් උල්ලංඝනයන්වලට අදාළ නඩු ඇසීම සඳහා ම සැලසුම් කළ විශේෂ අධිකරණයක මෙම අපරාධ විභාග කිරීමයි. ජාත්‍යන්තර ක්‍රියාකාරීන් ඇතුළත් කරගෙන දෙමුහුන් අධිකරණයක් නිර්මාණය කිරීමට, මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය විසින් ශ්‍රී ලංකාව පිළිබඳව විමර්ශනය කර ලබා දී ඇති වාර්තාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නිර්දේශ කර ඇත. එම වාර්තාව මගින් ඊට පෙර සම්මත වූ යෝජනා සම්මතයක් උධෘත කරමින් මෙසේ සඳහන් කරන ලදී: “වාර්තාවේ ඇතුළත් චෝදනා පිළිබඳව මානව හිමිකම් කමිටුව විසින් ඉල්ලා ඇති පරිදි ‘ස්වාධීන සහ විශ්වසනීය විමර්ශනයක්’ වහා ම සිදු කිරීමට හෝ ‘එම උල්ලංඝනයන් සඳහා වගකිව යුත්තන් වගකීමෙන් බැඳීමට සැළැස්වීමට’ තරම් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රමවේදය තවමත් සූදානම් නැති අතර ම අවශ්‍ය කරුණුවලින් සම්පූර්ණ වී නොමැත”.[81] ලිංගික ප්‍රචණ්ඩත්වය වැනි මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට, විශේෂ කාර්ය පටිපාටි භාවිත කිරීමට, ඉක්මණින් තීරණ ගැනීම ආදිය සඳහා වඩා හොඳින් පුහුණු කරනු ලැබූ විනිසුරුවරුන්, විමර්ශකයන් සහ නීතිඥයන් අන්තර්ගත කිරීමට විශේෂ දෙමුහුන් අධිකරණය මගින් පහසුකම් සලසනු ඇත. එසේ ම විශේෂ දෙමුහුන් අධිකරණය මගින් මෙම මතභේදයට තුඩුදුන් නඩු ස්වාධීන සහ අපක්ෂපාතී අධිකරණ නිලධාරීන් අතට පත් කරනු ඇතැයි බලාපොරොත්තු වේ.[82] “විශේෂ නීතීඥවරයෙකු සහිත

---

[76] අධිකරණ සහායකගේ නඩු ගොනුව, *ඉහත* 58 සටහන 22 පිටුව

[77] උදා: බලන්න- ප්‍රොසෙකියුටර් එදිරිව සෙන්ජිලි ඩිලැලික් සහ තවත් අය, නඩු අංක. IT-96-21/T, නඩු විභාග අධිකරණය, තීන්දුව, 1998 නොවැම්බර් 16, 942-943 ඡේද; ප්‍රොසෙකියුටර් එදිරිව ඩ්‍රැගල්ජුබ් කුනාරක් සහ තවත් අය (තීන්දුව), නඩු අංක. IT-96-23/I-A, අභියාචනාධිකරණය, 2002 ජුනි 12, 134-156, 185 ඡේද; ප්‍රොසෙකියුටර් එදිරිව ලෝරන්ට් සෙමන්සා (තීන්දුව සහ දඬුවම), නඩු අංක. ICTR 97-20-T, නඩු විභාග අධිකරණය, 2003 මැයි 15, 482 ඡේදය

[78] හ්‍යුමන් රයිට්ස් වොච්, “අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්”, *ඉහත 1 සටහන;* ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, “නිහඬ කරවූවන්”, *ඉහත 1 සටහන*; එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, A/HRC/30/61, *ඉහත* 1 සටහන

[79] හ්‍යුමන් රයිට්ස් වොච්, “අපි නුඹලාට පාඩමක් උගන්වන්නම්”, *ඉහත සටහන 1 පිටු 4, 87*

[80] ප්‍රොසෙකියුටර් (රජයේ නීතිඥ) එදිරිව ඇන්ටෝ ෆුරුන්ඩ්ජා (නඩු විභාග තීන්දුව), IT-95-17/1-T, පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය, 1998 දෙසැම්බර් 10

[81] මානව හිමිකම් කවුන්සිලය, මානව හිමිකම් පිළිබඳ මහ ලේකම්වරයාගේ කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාව (OISL), A/HRC/30/CRP.2 (2015 දෙසැම්බර් 1) ¶1278 (A/HRC/RES/25/1උධෘත කර ඇත, පූර්විකාව)

[82] භවානි ෆොන්සේකා සහ ලුවී ගනේෂදාසන්, දෙමුහුන් එදිරිව දේශීය: ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ මිථ්‍යාවන්, යථාර්ථයන් සහ විකල්ප (2016 ජනවාරි), මෙතැනින් බලන්න: http://www.cpalanka.org/hybrid-vs-domestic-myths-

යෝජිත අධිකරණ යාන්ත්‍රණයක්" පිළිබඳව විදේශ කටයුතු භාර ඇමතිවරයා සැප්තැම්බර් මස දී කතා කළේ විශේෂ අධිකරණයක් පිළිබඳව අඟවමිනි.[83] මෙම වචන උකහාගෙන තිබුණේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ යෝජනා සම්මතයේ 6 වන ඡේදයෙනි.[84] කෙසේ වුව ද, එවැනි අධිකරණයක් නිර්මාණය කිරීමෙහි ලා රජය "කඩිමුඩියේ" ක්‍රියා නොකරන බව සිරිසේන ජනාධිපතිවරයා ජනවාරි මස දී පැවසුවේය[85] විශේෂ අධිකරණය නිර්මාණය කිරීමේ දී ජාත්‍යන්තරයේ සහභාගි වීම පිළිබඳව යම් මතභේද පැවතුණි. කෙසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව සහ ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තරය සහභාගි වීම සම්බන්ධයෙන් පවතින දීර්ඝ ඉතිහාසය දෙස බැලූ විට එවැනි අධිකරණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවත්, කළ හැකි (feasible) බවත්, අවශ්‍ය බවත් පෙනී යයි.[86]

විශේෂ අධිකරණයට අදළ පනත තුළ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා ඇති ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් පැහැදිලිව සඳහන් විය යුතු ය. ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පමණක් ම කටයුතු කරන විශේෂ අධිකරණයක් හෝ අධිකරණ ශාලාවක් නිර්මාණය කිරීම වඩා සුදුසු වේ. ලයිබීරියාව මෙම ක්‍රමය ක්‍රියාත්මක කළේ ඊ (E) නමැති විශේෂ අධිකරණයක් පිහිටුවමිනි.[87] විශේෂ අධිකරණයක් ඇති විට වෙනත් අපරාධ සඳහා නඩු පැවරීම සඳහා එල්ල වන පීඩනය හමුවේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා මගහැරී නොයන බවට වගබලා ගත හැකි අතර, ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අතපසු වී ඇති නඩු විශාල ප්‍රමාණය ඉක්මණින් විභාග කිරීමට ද අධිකරණ නිලධාරීන්ට වඩා ඉක්මණින් විශේෂඥ දැනුම ලබා ගැනීමට ද හැකි වේ.[88] එසේ ම, වෙනම අධිකරණයක් ඇති විට අනන්‍යතාව සුරැකීම සහ ආරක්ෂක පියවර වැනි ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ වැදගත් වන විශේෂ ක්‍රියා පටිපාටි සහ ප්‍රමිතීන්

---

realities-and-options-for-transitional-justice-in-sri-lanka/; කැලිෆෝනියා සරසවියේ බර්ක්ලී මානව හිමිකම් මධ්‍යස්ථානය, දිගු මාවත-ගැටුම් පවතින සහ පශ්චාත් ගැටුම් තත්ත්වයන් තුළ ලිංගික ප්‍රචණ්ඩත්වයට වගවීම (The Long Road Accountability for Sexual Violence in Conflict and Post-Conflict Settings), 65 (2015); ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව: එක්සත් ජාතීන්ගේ වගවීම පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර අධිකරණයේ (ICJ) ප්‍රකාශය (2015 දෙසැම්බර් 30), මෙතැනින් බලන්න http://www.icj.org/sri-lanka-icj-statement-on-un-accountability-report; ඩේලි ෆයිනෑන්ෂල් ටයිම්ස් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනා සම්මතය පිළිබඳ විශ්ලේෂණයක් (2015 ඔක්තෝම්බර් 6), මෙතැනින් බලන්න http://www.ft.lk/article/479397/An-analysis-of-the-UNHRC-Resolution-on-Sri-Lanka

[83] කලම්බු ටෙලිග්‍රාෆ්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ශ්‍රී ලංකාවේ පිළිතුර: විදේශ කටයුතු අමාත්‍යවරයා අද සිදු කළ කතාව සම්පූර්ණයෙන්, මෙතැනින් බලන්න https://www.colombotelegraph.com/index.php/sri-lankas-response-to-unhrc-the-full-text-of-foreign-affairs-ministers-speech-today/

[84] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම: යෝජනා සම්මතය/ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගන්නා ලදී, A/HRC/30/L.29 *ඉහත* 1 සටහන 6 පිටුව

[85] News.lk, යුද අපරාධ පිළිබඳ විශේෂ අධිකරණයක් පිහිටුවීමට ශ්‍රී ලංකාව කලබලෙන් කටයුතු කරන්නේ නැහැ (SL would not act 'in haste' on war crimes special court) - ජනාධිපති, මෙතැනින් බලන්න: http://www.news.lk/news/politics/item/11607-sl-would-not-act-in-haste-on-war-crimes-special-court-president

[86] භවානි ෆොන්සේකා සහ ලුවී ගනේෂදාසන්, දෙමුහුන් එදිරිව දේශීය: ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ මිථ්‍යාවන්, යථාර්ථයන් සහ විකල්ප (2016 ජනවාරි), මෙතැනින් බලන්න: http://www.cpalanka.org/hybrid-vs-domestic-myths-realities-and-options-for-transitional-justice-in-sri-lanka/

[87] ලයිබීරියානු නායකයා 'ඊ' යනුවෙන් අපරාධ අධිකරණයක් පිහිටුවයි (2008 දෙසැම්බර් 3), මෙතැනින් බලන්න: http://www.emansion.gov.lr/2press.php?news_id=972&related=7&pg=sp

[88] ලයිබීරියාවේ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඩලීම, මෙතැනින් බලන්න: http://stoprapenow.org/uploads/features/SGBVemail.pdf

ක්‍රියාත්මක කිරීමට ද පහසු වනු ඇත. කෙසේ වුව ද, වෙනම අධිකරණයක් පිහිටුවීම බෙහෙවින් වියදම් සහගත කටයුත්තක් විය හැකි අතර, රහස්‍යභාවය සහ ආරක්ෂාව වැනි විශේෂ ක්‍රියා පටිපාටි පිළිපැද්දත් සමාජයෙන් එල්ල වන නිශේධනාත්මක බලපෑම ඉහළ යාම හේතුවෙන් එමගින් වඩා හොඳ ප්‍රතිඵල නොලැබීමට ද ඉඩ තිබේ. මෙම සන්දර්භය තුළ, සහන සොයා යාම සඳහා වින්දිතයන් සවිබල ගැන්වීම අභියෝගාත්මක විය හැකිය. එබැවින්, වගවීම හඹා යන බවට සහ එය නෛතික, ප්‍රතිපත්තිමය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළු පුළුල් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් සමග අනුපිළිවෙලින් සිදුවන බවට සහතික වෙමින් ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ පුළුල් ගැටලු පිරික්සා බැලීම අත්‍යවශ්‍ය වේ.

ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු පැවරීම් විශේෂ අධිකරණයක දී සිදු වුවත් නැතත්, විනිසුරුවරුන්, නීතිඥවරුන්, සහ විමර්ශකයන් ඇතුළු අධිකරණ කටයුතුවලට සම්බන්ධ ක්‍රියාකාරීන් සියලු දෙනා ම ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පුහුණු කළ යුතු ය. නුසුදුසු ලෙස ප්‍රශ්න ඇසීමෙන් සහ නින්දාසහගත අයුරින් සැලකීමෙන් වින්දිතයන් නැවත වරක් කම්පනයට පත් වන අතර එය ඔවුන් යුක්තිය සොයා පැමිණීමට අදිමදි කිරීමට හේතු වේ. එබැවින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවක් ඇති නීතිඥවරුන්, විනිසුරුවරුන්, විමර්ශකයන් සහ අධිකරණ නිලධාරීන් භාවිත කිරීමට උත්සාහ කළ යුතු ය. කාන්තා වින්දිතයන් වඩා කැමති කාන්තාවන් සමග සිය අත්දැකීම් පැවසීමට බව පෙනී ගොස් තිබේ.[89] පිරිමි සහ කාන්තා වින්දිතයන්ගේ කැමැත්ත එකිනෙකාට වෙනස් විය හැකි නිසා හැකි සෑම විට ම කාන්තා හෝ පිරිමි අධිකරණ නිලධාරීන් තෝරා ගැනීමේ අවස්ථාව වින්දිතයන්ට ලබා දීම වඩා සුදුසු වේ. කෙසේ වුව ද, තමන්ට එතරම් පහසුවක් නොදනෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයකට අයත් නිලධාරීන් සමග පවා ගනුදෙනු කිරීමට සමහර අවස්ථාවල වින්දිතයන්ට සිදු වන නිසා සියලු ම දෙනා පුහුණු කළ යුතු ය. අධිකරණ ශාලාවක සිදු කෙරෙන ක්‍රියා පටිපාටිය තුළ අනන්‍යතාව හෙළි නොකිරීමට සහ සාක්ෂි දෙන වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරැකීමට ඉඩ සැලසිය යුතු ය. නිදසුනක් ලෙස, අධිකරණයෙන් පිටත සිට හෝ වීඩියෝ පටයක් හරහා හෝ තිරයක් පිටුපස සිට සාක්ෂි දීම, කටහඬ විකෘති කිරීම, සහ සාක්ෂි දීමේ දී සංකේත භාෂාවක් (coded language) භාවිත කිරීම වැනි ක්‍රම විශේෂයෙන් ප්‍රයෝජනවත් වනු ඇත. අනන්‍යතාව ආරක්ෂා කිරීම සහ සෙසු ආරක්ෂණ පියවර අධිකරණ ශාලාවෙන් සහ නඩු විභාගයෙන් ඔබ්බට ද ක්‍රියාත්මක විය යුතු අතර, අධිකරණයට පැමිණීමේ දී සහ ආපසු යාමේ දී ද වින්දිතයන්ගේ ආරක්ෂාව සහ අනන්‍යතාව සුරැකිය යුතු ය. ද්‍රවිඩ සහ සිංහල භාෂා දෙක ම කතා කරන අධිකරණ නිලධාරීන්ගේ අවශ්‍යතාව වැනි ප්‍රායෝගික ගැටලුවලට ද විසඳුමක් ලබා දිය යුතු වේ.

අවසන් වශයෙන්, සාක්ෂිවල ප්‍රමිතිය ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව නඩු පැවරීම සඳහා ගැලපෙන පරිදි සැකසිය යුතු අතර එම ප්‍රමිතීන් පැහැදිලිව අර්ථ දැක්විය යුතු ය. ඒවා වින්දිතයන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී විය යුතු අතර ම, යුද සමයේ සිදු වූ අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි එක්රැස් කිරීමෙහි ලා ඇති සීමාවන් හඳුනාගත යුතු ය. ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ සාක්ෂි සහ ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් ඇති රීති හෝ පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ක්‍රියාපටිපාටි සහ සාක්ෂි සම්බන්ධයෙන් පවතින රීති වැනි වෙනත් අධිකරණවල පවතින නිශ්චිත රීති ප්‍රයෝජනවත් මාර්ගෝපදේශකයක් සපයයි. නිදසුනක් ලෙස, "ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය කරන ආකාරයේ හැසිරීම්වලට අදාළ ස්ථිර රටාවක් පිළිබඳ සාක්ෂි යුක්තියේ නාමයෙන් පනත යටතේ පිළිගැනීමට හැකි" බව පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ සහ රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ප්‍රඥප්තිවල ක්‍රියාපටිපාටි සහ සාක්ෂි සම්බන්ධ රීතිවල දැක්වේ.[90] සිදුවීම් ගණනාවක දී ම පහත කරුණු සම්බන්ධයෙන් රටාවක් පෙන්නුම් කරන අවස්ථාවල රටාවක් පැවති බව

---

[89] උතුර සමග සම්මුඛ සාකච්ඡාව 2016 ජනවාරි 23

[90] පැවති යුගොස්ලාවියාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ක්‍රියාපටිපාටි සහ සාක්ෂි සම්බන්ධ රීති, මෙතැනින් බලන්න: http://www.icty.org/x/file/Legal%20Library/Rules_procedure_evidence/IT032Rev50_en.pdf; රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ප්‍රඥප්තිවල ක්‍රියාපටිපාටි සහ සාක්ෂි සම්බන්ධ රීති, මෙතැනින් බලන්න: http://www1.umn.edu/humanrts/africa/RWANDA1.htm

බොහෝ විට ඔප්පු වේ: එනම්, "(I) වරදකරුවන්ගේ විස්තර; (II) වින්දිතයන්ගේ විස්තර; (III) භූගෝල විද්‍යාත්මකව සහ කාලානුක්‍රමිකව අපරාධය පැතිරී ඇති ආකරය; (IV) අපරාධය සිදු කර ඇති ක්‍රියා පිළිවෙල."[91] "සංඛ්‍යාලේඛන සහ අපරාධ සිතියම්ගත කිරීම සම්බන්ධයෙන් විශේෂඥයන් විසින් දෙනු ලබන සාක්ෂි ප්‍රකාශ" අනුසාරයෙන් පෙන්නුම් කෙරෙන රටාවකට සිදු වී ඇති බවට පවතින සාක්ෂි (pattern evidence) ජාත්‍යන්තර අපරාධ රැසක් සඳහා සාර්ථකව භාවිත කර ඇත. එහෙත් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීමේ දී එය භාවිත වී ඇත්තේ සීමාසහිතව ය.[92] කෙසේ වුවද, ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ද රටාවකට සිදු වී ඇති බවට පවතින සාක්ෂි යොදා ගන්නා ලෙසට නිර්දේශ යෝජනා වී තිබේ.[93] ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් රටාවකට සිදු වී ඇති බවට පවතින සාක්ෂි යොදා ගැනීමට ශ්‍රී ලංකාවේ පිහිටුවීමට අපේක්ෂිත විශේෂ අධිකරණයේ ක්‍රියාපටිපාටි සහ සාක්ෂි පිළිබඳ රීති මගින් ද පැහැදිලිව ම ඉඩ දිය යුතු ය. වීඩියෝ මාර්ගයෙන් සාක්ෂි දීමට ඉඩ දීම මගින් ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් වන්නන් ඇතුළු විශේෂඥයන්, වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගෙන් ආරක්ෂා සහිතව මෙන් ම අඩු පිරිවැයකින් අවශ්‍ය සාක්ෂි ප්‍රකාශ ලබා ගැනීමට අධිකරණයට පහසු වනු ඇත. වින්දිතයන් බොහෝ දෙනෙකු රටින් පළාගොස් ඇති අතර ආරක්ෂක හේතු මත නැවත පැමිණීමට බියක් දක්වති. ජාත්‍යන්තර අපරාධ අධිකරණය ද සමහර අවස්ථාවල වීඩියෝ සබඳතාවක් ඔස්සේ සාක්ෂි දීමට ඉඩ දීමට පටන්ගෙන ඇත. ඊට ගැලපෙන තාක්ෂණය සහ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් මග පෙන්වීමක් ලබා ගැනීමට එම අධිකරණයෙන් උපදෙස් පැතිය හැකි ය.[94]

**☛☛ පරිපාලනමය හානි පූරණය**

අධිකරණය විසින් නියම කරනු ලබන වන්දි සහ අපරාධයට වැරදිකරු වශයෙන් තීන්දු කිරීමට අමතරව පරිපාලනමය වශයෙන් ද හානි පූරණයක් (වන්දි ගෙවීමක්) සිදු කිරීම ඉතා වැදගත් වේ. අධිකරණයෙන් බාහිරව සිදු කරනු ලබන වැඩසටහන් මගින් අධිකරණමය ක්‍රියාවලියට වඩා වින්දිතයන් බොහෝ ප්‍රමාණයකට ළඟා වීමට මෙන් ම, වින්දිතයන්ට වඩාත් සංවේදී ක්‍රියාපටිපාටි භාවිත කිරීමට ද හැකි වන අතර, ඒවාට වැය වන පිරිවැය ද සැලකිය යුතු තරම් අඩු ය.[95] පරිපාලනමය හානි පූරණ වැඩසටහනක් සැලසුම් කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන සහ වින්දිතයන් සම්බන්ධ කර ගැනීමට ද අධිකරණ ක්‍රියාවලියට වඩා බෙහෙවින් පහසු වේ.[96]ගැටුමෙන් පීඩාවට පත් වූ වින්දිතයන් සඳහා හානි පූරණය කිරීම සම්බන්ධයෙන් මීට පෙර පැවති විමර්ශන කොමිෂන් සභා විසින් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර ඇත.[97]

---

[91] සැබීර් අගිරේ අරන්බුරු (Xabier Agirre Aranburu), "ලිංගික ප්‍රචණ්ඩත්වය සාධාරණ සැකයෙන් ඔබ්බට: රටාවකට සිදු වී ඇති බවට පවතින සාක්ෂි සහ විශ්ලේෂණ ජාත්‍යන්තර නඩු සඳහා යොදා ගැනීම, ("Sexual Violence beyond Reasonable Doubt: Using Pattern Evidence and Analysis for International Cases), Leiden Journal of International Law", 610 (2010), පිටු. 609–627 C Foundation of the Leiden Journal of International Law, මෙතැනින් බලන්න: http://www.usip.org/sites/default/files/missing-peace/Xabier%20Aranburu.pdf

[92] *එහිම*

[93] *එහිම.*

[94] ජාත්‍යන්තර නීතිඥ සංගමය, ජාත්‍යන්තර අපරාධ අධිකරණය ඉදිරියේ පෙනී සිටි සාක්ෂිකරුවන්, 18 (2013 ජූලි)

[95] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජූනි); රුබියෝ-මැරින්, *ඉහත 15 සටහන*

[96] රුබියෝ-මැරින්, *ඉහත 15 සටහන* 103 පිටුව

[97] භවානි ෆොන්සේකා, පරිපූර්ණ හානි පූරණ ප්‍රතිපත්තියක අවශ්‍යතාව (The Need for a Comprehensive Reparations Policy), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, (2015 අප්‍රේල්), මෙතැනින් බලන්න http://www.cpalanka.org/wp-content/uploads/2015/04/The-Need-for-a-Comprehensive-Reparations-Policy-and-Package2.pdf

හානි පූරණය සඳහා කාර්යාලයක් පිහිටුවීමට පොරොන්දු වී තිබුණ ද, ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන් සඳහා පිළියම් කිරීමේ අවශ්‍යතාව වත්මන් පරිපාලනය විසින් තවම පිළිගෙන නැත.

සත්‍යය, යුක්තිය, ප්‍රතිසන්ධානය සහ නැවත සිදු වීම වැළැක්වීමේ කොමිෂන් සභාවක් සහ හානි පූරණය කිරීම සඳහා කාර්යාලයක් පිහිටුවීමට ශ්‍රී ලංකා රජය දැනටමත් පොරොන්දු වී තිබේ. පරිපාලනමය වශයෙන් හානි පූරණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාවෙහි යෙදවීම සඳහා ව්‍යුහයක් මෙම යාන්ත්‍රණ මගින් ලබා දේ.[98] කොමිෂන් සභාව සහ වෙනත් අය විසින් ලබා දී ඇති නිර්දේශ එකට එක් කර රජය විසින් හානි පූරණ ප්‍රතිපත්තියක් ඇති කළ යුතු ය. එම ප්‍රතිපත්තිය මගින් ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් විසඳුම් ලබා දෙන අතරම, හානි පූරණය කිරීම සඳහා වන කාර්යාලය සහ හානි පූරණය ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා සම්බන්ධ වන සෙසු ආයතන සඳහා පැහැදිලි ව්‍යුහයක් ඉදිරිපත් කළ යුතු ය. නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පමණක් කොමිෂන් සභාවක් පිහිටුවීම ප්‍රමාණවත් නොවේ. සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවලට ඇති දේශපාලනික බලතල සීමා සහිත ය. එසේ ම, ඒවායින් ලබා දෙන නිර්දේශ අනිවාර්යයෙන් බැඳෙන (binding) බව පැවසුව ද එම නිර්දේශ ක්‍රියාත්මක නොවන බව වෙනත් සන්දර්භයන් තුළ පෙනී ගොස් තිබේ.[99] පෙර පැවති කොමිෂන් සභා රැසක නිර්දේශ ගණන් නොගෙන සිට ඇති බව ශ්‍රී ලංකා ඉතිහාසය දෙස බැලූ විට පෙනේ.[100] එබැවින් හානි පූරණ ක්‍රියාවලියට මග පෙන්වීම සඳහා ඉතා සැලකිලිමත් ලෙස ප්‍රතිපත්තියක් ලිවීම ඉතා වැදගත් වේ.

වින්දිතයන් විශාල සංඛ්‍යාවකගේ විවිධ අවශ්‍යතා වඩාත්ම සුදුසු අයුරින් ඉටු වන බවට සහතික වන පරිදි විවිධ ආකාරයේ හානි පූරණ ඒකාබද්ධ කර හානි පූරණ වැඩසටහන සැකසිය යුතු ය.[101] හානියට පත් වූවන් සඳහා සංවේදී සහ ඵලදායී වැඩසටහනක් සකසන බවට වග බලා ගැනීම සඳහා, හානි පූරණ වැඩසටහනක් සැකසීමේ දී වින්දිතයන්[102] මෙන් ම ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ ගැටලු සම්බන්ධයෙන්

---

[98] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම: යෝජනා සම්මතය/ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගන්නා ලදී, A/HRC/30/L.29 *ඉහත 14 සටහන* 4 පිටුව

[99] මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය, පශ්චාත් ගැටුම් පවතින ප්‍රදේශ සඳහා නීතියේ ආධිපත්‍යය මෙවලම් - හානි පූරණ වැඩසටහන්, HR/PUB/08/1, 11-12 (2008) (එල් සැල්වදෝරයේ සහ ගෝතමාලාවේ සත්‍යය කොමිෂන් සභාවල නිර්දේශ ගණන් නොගන්නා ලද බව සැලකිය යුතු ය.)

[100] International Crisis Group, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය: අන් කවරදාටත් වඩා දුෂ්කරය (Reconciliation in Sri Lanka: Harder than Ever), 3 (2011 ජුලි 18), මෙතැනින් බලන්න http://www.crisisgroup.org/~/media/Files/asia/south-asia/sri lanka/209%20Reconciliation%20in%20Sri%20Lanka%20-%20Harder%20than%20Ever.pdf (අසාර්ථක වූ සහ ගණන් නොගන්නා ලද තත්කාර්ය විමර්ශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට දිගු ඉතිහාසයක් තිබේ")

[101] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි); දේශපාලන කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුව, සටන් විරාම සහ සාම ගිවිසුම් තුළ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලබා දීම, 50 (2012), මෙතැනින් බලන්න page http://www.un.org/wcm/webdav/site/undpa/shared/undpa/pdf/DPA%20Guidance%20for%20Mediators%20on%20Addressing%20Conflict-Related%20Sexual%20Violence%20in%20Ceasefire%20and%20Peace%20Agreements.pdf

[102] ක්‍රිස්ටියන් කොරෙයා, ජුලියා ගිලරොට්, ලීසා මාගරල්, හානි පූරණ සහ වින්දිතයන්ගේ සහභාගිත්වය (Reparations and Victim Participation): සත්‍යය කොමිෂන් සභාවේ අත්දැකීම් දෙස හැරී බැලීමක් (A Look at the Truth Commission Experience), මෙතැනින් බලන්න https://www.ictj.org/sites/default/files/ICTJ-Global-Reparations-Participation-2009-English.pdf

කටයුතු කරන සිවිල් සමාජ කණ්ඩායම් ද රජය විසින් සම්බන්ධ කර ගත යුතු ය.[103] අවසන් වශයෙන්, ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවකට ලක් වී දිවි ගලවා ගත්තවුන් වශයෙන් අපකීර්තියට මුහුණ දෙන වින්දිතයන්ගේ රහස්‍ය භාවය ආරක්ෂා වන බවට සහතික වන අයුරින් හානි පූරණය සැලසුම් කළ යුතු ය.

## ප්‍රතිෂ්ඨාපන (Restitution) **සහ වන්දි**

ප්‍රතිෂ්ඨාපන සහ වන්දි අධිකරණමය ක්‍රියාවලියක් මගින් ද ප්‍රදානය කළ හැකි ය. බොහොමයක් වින්දිතයන් අධිකරණමය ක්‍රියාමාර්ගයකට යොමු වීමට කැමති නොවීම හෝ ඔවුන්ට එසේ යොමු වීමට හැකියාවක් නොතිබීම, අපරාධකරුවන් හඳුනා ගැනීමට ඔවුන්ට නොහැකි වීම, සහ අධිකරණමය ක්‍රමවේදය බල ගන්වා අපරාධකරුවන් වැරදි කරුවන් බවට තීන්දු කරනු ලැබුවද ප්‍රදානය කරනු ලැබූ වන්දි මුදල නොගෙවීමට ඉඩ තිබීම වැනි හේතු නිසා ප්‍රතිෂ්ඨාපන සහ වන්දි ගෙවීම සඳහා අමතර පරිපාලනමය වැඩසටහනක් පැවතීම ඉතා වැදගත් වේ.[104] යෝජිත ප්‍රතිෂ්ඨාපනය සඳහා වන කාර්යාලය සහ යෝජිත සත්‍යය, යුක්තිය සහ ප්‍රතිසංවිධානය පිළිබඳ කොමිෂන් සභාව වින්දිතයන්ට ප්‍රතිෂ්ඨාපන ප්‍රදානය කිරීම සඳහා වඩාත්ම සුදුසු ආයතනය වුව ද, මෙම ලේඛනය ලියන අවස්ථාව වන විට එවැනි කිසිවක් පිළිබඳව ප්‍රසිද්ධියේ සඳහන් වී නොමැත.

ප්‍රතිෂ්ඨාපන සහ වන්දි ගෙවීම අධිකරණමය වගවීමක් සහ සමාව අයැදීමත් සමග සමගාමීව සිදු විය යුතු ය. එසේ නොමැති වුවහොත් වන්දිය ලැබුණේ ලිංගික සේවා සඳහා ගාස්තුවක් වශයෙන් හෝ මුදල් ගෙවා වින්දිතයන් නිහඬ කරවීමට බවට වින්දිතයන් සහ ඔවුන් අයත් ප්‍රජාවන් විසින් අර්ථ කථනය කිරීමට ඉඩ තිබේ. නිදසුනක් ලෙස, ගෝතමාලාවේ වින්දිතයන්ට වන්දි මුදල් බෙදා දීමෙන් පසුව ඔවුන් "කැමැත්තෙන් ම සතුරන්ට මුදලට ලිංගික සේවය ලබා දුන්" අය ලෙස ප්‍රජාව විසින් චෝදනා කරන ලදී.[105] මෙම වන්දි සහ ප්‍රතිෂ්ඨාපන බෙදා හැරීමේ දී රහස්‍යභාවය සහ සංවේදී බව ආරක්ෂා කිරීම ද අත්‍යවශ්‍ය වේ.

"ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බැරෑරුම් ලෙස උල්ලංඝනය වීමක් හෝ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය වීමක් සිදු වීමට පෙර වින්දිතයා සිටි තත්ත්වයට ඔහු/ඇය නැවත පත් කිරීම" ප්‍රතිෂ්ඨාපන මගින් බලාපොරොත්තු වේ.[106] ලිංගික ප්‍රචණ්ඩත්වයක දී මෙය කිරීමට අපහසු වන්නේ ශාරීරික සහ මානසික සෞඛ්‍යයට සහ සමාජ තත්ත්වයට ඇති වූ බලපෑම ආපසු හැරවීමට නොහැකි වීමට ඉඩ ඇති නිසා ය.[107] රටේ උතුරු ප්‍රදේශයේ හමුදාකරණයක් සහිත ප්‍රදේශවල ජීවත් වන වින්දිතයන් දිගින් දිගට ම හමුදාවේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට මුහුණ දෙන බවත්, තව දුරටත් රඳවා තබා ගනිතැයි යන බියෙන් සහ අපචාරයට ලක් වෙතැයි බියෙන් ජීවත් වන බවත් වාර්තා මගින් පෙන්වා දෙයි.[108] මෙම බිය

---

[103] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි); එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම: යෝජනා සම්මතය/ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගන්නා ලදී, A/HRC/30/L.29 *ඉහත 14 සටහන* 3 පිටුව ("වින්දිතයන් සහ සිවිල් සමාජය ඇතුළත් වන සේ රාජ්‍ය නොවන සංවිධාන ද ඇතුළත්ව බලපෑමට ලක් වූ සියලු ම ප්‍රජාවන්ගෙන් ජාතික මට්ටමෙන් පුළුල් ලෙස අදහස් විමසමින් සත්‍යය සොයා යාමේ, යුක්තිය, හානි පූරණය, සහ නැවත සිදු නොවන බවට සහතික වීමේ ක්‍රියාවලීන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අදහස් ලබා ගැනීම මගින් එම ක්‍රියාවලීන්ගේ විශ්වසනීයත්වය සවිමත් කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා රජයේ කැපවීමට සහය දීම")

[104] Fionnuala N´ı Aol´ain, Catherine O'Rourke, Aisling Swaine, ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණ පරිණාමනය කිරීම: මූලධර්ම සහ භාවිතාවන් (Transforming Reparations for Conflict-Related Sexual Violence: Principles and Practice), Harvard Human Rights Journal / Vol. 28, පිටුව 135

[105] රුබියෝ-මැරින්, *ඉහත 15 සටහන* 94 පිටුව

[106] එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, *මූලික ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශක*, *ඉහත* 13 සටහන පිටුව 19

[107] Fionnuala, *ඉහත 104* සටහන පිටුව 119

[108] උතුරේ දී සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි 22

නිසා විශේෂයෙන් කාන්තාවන් ඇතුළු බොහොමයක් වින්දිතයන් "නිවසින් පිටත සිදු කරන දෛනික ක්‍රියාකාරකම් හැකිතාක් සීමා කිරීම" වැනි ආරක්ෂාකාරී පියවර ගැනීමට පෙළඹෙන අතර එමගින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය තවත් නරක අතට හැරේ.[109] අපචාර සහ එහි ප්‍රතිඵලයක් ලෙස හටගන්නා බිය හේතුවෙන් වින්දිතයන් ආර්ථික වශයෙන් කොන් වීමට ලක් වී ඇති විට දේපල සහ ජීවන තත්ත්වය නැවත ලබා දීම සහ කඩාකප්පල් වූ අධ්‍යාපනය සහ අහිමි වූ රැකියාවෙහි නැවත පිහිටුවීම මගින් ඵලදායී විසඳුමක් ලබා දිය හැකි ය.[110] ශ්‍රී ලංකාවේ දී මින් අදහස් වන්නේ හානි පූරණය අවශ්‍ය සෙසු ක්‍රියාමාර්ග සමග එකට බැඳී ඇති බවයි. නිදසුනක් ලෙස, තවමත් හමුදාව සහ වෙනත් අය විසින් අත්පත් කරගෙන සිටින වින්දිතයන්ට අයත් ඉඩම් නැවත ඔවුන්ට ලබා දිය යුතු අතර, වින්දිතයන්ට නැවතත් සිය ජීවනෝපාය මාර්ගය ඇරඹීමට හැකි වන පරිදි ධීවර කර්මාන්තය වැනි අනෙකුත් සම්පත්වලට ප්‍රවේශය ලැබෙන බවට වග බලාගත යුතු ය.[111]

උල්ලංඝනයන් හේතුවෙන් සිදු වන ශාරීරික හෝ මානසික හානි, අහිමි වූ අවස්ථාවන් සහ ආදයම්, සහ සදාචාරමය හානි ඇතුළු "ආර්ථිකමය වශයෙන් ගණනය කළ හැකි හානි සඳහා වන්දි ලබා දිය යුතු ය".[112] ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවකින් සිදු වූ ආර්ථිකමය හානිය තක්සේරු කරන විට වින්දිතයාගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මෙන් ම සංස්කෘතිය තුළ වින්දිතයාට ඇති සුවිශේෂී බලපෑම් පිළිබඳව සැලකිල්ලට ගැනීම වැදගත් වේ. ලිංගික අපචාරයකට ලක් වූවෙකු ලෙස හඳුනා ගැනීම හේතුවෙන් ප්‍රජාව තුළ ඇති වන අපකීර්තිය සහ කොන් කිරීම වින්දිතයන්ගේ ආදයම් මාර්ගවලට මෙන් ම විවාහයක් කර ගැනීමේ දී ද බලපායි.[113] මෙම බලපෑම් හඳුනාගෙන ඒවාට ප්‍රමාණ කර දැක්විය හැකි අගයක් නියම කළ යුතු ය. ඊට අමතරව, වන්දි ප්‍රදානය කරන ක්‍රමය ද සලකා බැලීම අවශ්‍ය වේ. විශේෂයෙන් කාන්තා වින්දිතයන්ට එක වර සම්පූර්ණ මුදලක් ගෙවූ විට එම මුදල ඥාතීන්ට ලබා දෙන ලෙස හෝ පවුලේ ණය ගෙවීම සඳහා ලබා දෙන ලෙසට ඔවුන්ට පීඩනයක් එල්ල වීමට ඉඩ තිබේ.[114] දකුණු අප්‍රිකාවේ එසේ වින්දිතයන්ට එකවර ගෙවීමක් සිදු කිරීමෙන් පසුව මෙවැනි බලපෑමක් සිදු වූ බව සමීක්ෂකයන් දැක ඇත. මෙම ගැටලුව ශ්‍රී ලංකාවේ ද සිදුවීමට ඉඩ ඇති බව උතුරේ සහ නැගෙනහිර සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් හැඟේ. එවැනි වින්දිතයන්ට විශ්‍රාම වැටුපක් වැනි ගෙවීමක් මාසිකව ලබා දීමෙන් වන්දි ගෙවීමේ අරමුණ වඩා හොඳින් ඉටු කර ගැනීමට හැකි වනු ඇත.[115] විශාල මුදලක් ලැබීම වින්දිතයන්ට ස්වාධීනත්වය ළඟා කර

---

[109] නිම්මි ගෞරිනාදන් සහ කේට් ක්‍රොනින් ෆර්මන් සදහටම වින්දිතයන්? පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ කාන්තාවන් (The Forever Victims? Tamil Women In Post-War Sri Lanka), (2015 අගෝස්තු 28)

[110] Fionnuala, *ඉහත 104* සටහන පිටුව 120

[111] භවානි ෆොන්සේකා, ශ්‍රී ලංකාවේ මෑත කාලීනව සිදු වූ ඉඩම් අත්පත් කරගැනීම්, නෙරපීම් සහ ඒ හා සම්බන්ධ ගැටලුවලට අදාළ නෛතික සහ ප්‍රතිපත්තිමය තත්ත්වය (Legal and Policy Implications of Recent Land Acquisitions, Evictions and Related Issues in Sri Lanka), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2014; භවානි ෆොන්සේකා සහ දර්ශා ජෙගදීෂ්වරන්, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ඉඩම් අත්පත් කරගැනීම් සහ ඊට අදළ ගැටලුවලට අදළ දේශපාලනය, ප්‍රතිපත්ති සහ භාවිතාවන් (Politics, Policy & Practices with Land Acquisitions and Related Issues in the North and East of Sri Lanka), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2013; ; භවානි ෆොන්සේකා සහ මිරාක් රහීම්, උතුරු පළාතේ ඉඩම්ඃ පශ්චාත් යුද දේශපාලනය, ප්‍රතිපත්ති සහ භාවිතාවන් (Land in the Northern Province: Post War Politics, Policy and Practices) විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2011.

[112] එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, *මූලික ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශක*, *ඉහත* 13 සටහන පිටුව 20

[113] දිනුක් කොළඹගේ, *ඉහත* 2 සටහන; ; Fionnuala, *supra ඉහත 104* සටහන පිටුව 121; එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි) පිටුව 17

[114] උතුරු ප්‍රදේශයේ සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි 23

[115] උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිවිල් සමාජය සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි; රුබියෝ-මැරින්, *ඉහත* 13 සටහන; කාන්තාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආයතනය (Un Women), දූෂණය යුධෝපායක් ලෙස, 93 මෙතැනින් බලන්නඃ

ගැනීම සඳහා උපකාරී විය හැකි වුව ද[116], විශාල මුදලක් එකවර අතට ලැබීමේ අවදානම සලකා බලන කල කුසලතා පුහුණුවක් සමග මාසික දීමනාවක් ලබා දීම මගින් වින්දිතයන්ට සිදු වූ හානියට වන්දියක් ගෙවන අතර ම ඔවුන් ස්වයං පෝෂිත වන බවට ද වග බලාගත හැකිය.

**පුනරුත්ථාපනය**

ඕනෑම සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයක සාර්ථකත්වය සඳහා මෙන් ම යළි ගොඩනැගීමෙහි ලා ප්‍රජාවන්ට ඇති හැකියාව සඳහා පුනරුත්ථාපනය අත්‍යවශ්‍ය වේ. ශාරීරික සහ මානසික සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ රැකියා පුහුණුව, සහ නිවාස සඳහා ප්‍රවේශය සුදුසු යෝග්‍ය පුනරුත්ථාපන වැඩසටහනකට ඇතුළත් විය යුතු ය.

ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ පිරිමින්, කාන්තාවන් මෙන් ම ළමුන් ද තමන් අපචාරයකට ලක් වූ බව තමන්ගේ ම පවුලේ කෙනෙකුට පවා පවසන අවස්ථා අඩු ය. සමහර අවස්ථාවල එසේ කරන්නේ සිය ආදරණීයයන්ට ඒ හේතුවෙන් ගැටලුවක් ඇති කිරීමට අකැමති නිසා ය. එසේම එසේ අපචාරය පිළිබඳව අනාවරණය කිරීමෙන් පසුව තමන්ගේ සමීපතමයන්ගෙන් පවා අපකීර්තියට ලක්වීම සහ නෙරපනු ලැබීමට ලක්වීමට සිදු වීම නිසා ය.[117] මේ හේතුව නිසා ඔවුන්ට කිසිදු මනෝ විද්‍යාත්මක සහයක් නොලැබෙන අතර, ඔවුහු බොහෝ විට මානසික අවපීඩනය (depression), පශ්චාත් ක්ෂති ක්ලමත ආබාධය (post-traumatic stress disorder) සහ වෙනත් මානසික සෞඛ්‍ය ගැටලුවලින් පෙළෙති.[118]පුනරුත්ථාපනයෙහි කොටසක් ලෙස මානසික සෞඛ්‍යය සේවා සැපයීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් වඩාත්ම අවදානම්පාත්‍රී (vulnerable) කණ්ඩායම වන්නේ දරුවන් ය. තමන්ට සිදු වූ කරදරයට ඈඳා ඇති කම්පනය සහ අපකීර්තිය නොසලකා සමාජයට එකතු වීමට ඔවුන්ට උපකාරී වීම සඳහා සුදුසු මනෝ විද්‍යාත්මක පියවර ගත යුතු ය. ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ වින්දිතයන් සිය පවුල තුළ මෙන් ම ප්‍රජාව තුළ ද ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීමට පෙළඹීමේ ඉඩක් ඇත. ඒ හේතුවෙන් සමාජය තුළ තවත් වින්දිතයන් බිහි වේ.[119] ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ප්‍රජාව තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ වෛවාහක ස්ත්‍රී දූෂණය වැඩි වී ඇති බව දැනටමත් වාර්තා වී තිබේ. මෙම වෙනසට හේතුව එවැනි දෑ පෙරට වඩා වැඩි වශයෙන් වාර්තා වීම සහ එල්.ටී.ටී.ඊ.ය මගින් ලබා දී තිබුණාට වැඩි නිදහසක් දැන් ලැබී තිබීම හෝ ඊටත් වඩා පොදුවේ ගතහොත් ගැටුමේ බලපෑම් ද විය හැකි ය.[120] එක් එක් පුද්ගලයන්ට සහ පොදුවේ ප්‍රජාවට ම ඇති වන බලපෑම අඩු කිරීම සඳහා මනෝ-සමාජයීය සහය ලබා දීම, මද්‍යසාරවලට ඇබ්බැහි වීම සඳහා ප්‍රතිකාර කිරීම, සහ වෙනත් පුනරුත්ථාපන සේවා වැදගත් වේ.

සිවිල් සමාජයේ, වින්දිතයන්ගේ සහ සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවක් වෙතොත් එහි ද උපදෙස්වලට සැලකිල්ල යොමු කරමින් සුදුසු පුනරුත්ථාපන සේවා සැපයීමට රජය විසින් පිහිටුවීමට යෝජිත හානි පූරණය කිරීම සඳහා පිහිටුවන කාර්යාලය මගින් වගබලාගත යුතු ය. ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලය (Office for National Unity and Reconciliation (ONUR)) මගින් සමාජ-ආර්ථික ගැටලු විසඳීම සඳහා ගැටුම් පරිණාමණය කිරීමේ වැඩසටහන් (Conflict Transformation Programmes) දැනටමත් සැලසුම් කරගෙන යන බව වාර්තා වේ.[121] දැනටමත් සිදු කරගෙන යන කටයුතු තව දුරටත් දියුණු

---

http://www.unwomen.org/~/media/headquarters/media/publications/unifem/evawkit_06_factsheet_conflictandpostconflict_en.pdf

[116] *එහිම*

[117] ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි; ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "තවමත් නිමා නොවූ යුද්ධයක්, *ඉහත* සටහන 1 පිටු 29, 8

[118] ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි; ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන*

[119] නිම්මි ගෞරිනාදන් සහ කේට් ක්‍රොනින් ෆර්මන්, *ඉහත* 109 සටහන

[120] *එහිම.*

[121] http://www.onur.gov.lk/index.php/en/programmes

කර ගෙන තිරසාර බව සහතික කිරීම සඳහා, හානි පූරණය සඳහා වන කාර්යාලය විසින් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලයේ උපදෙස් ලබාගත යුතු ය. එසේ ම ශාරීරික සහ මානසික පුනරුත්ථාපන සේවා ලබා දීම සඳහා හානි පූරණය සඳහා වන කාර්යාලය සෞඛ්‍ය අමාත්‍යංශය සමග එක්ව කටයුතු කළ යුතු ය. ගැටුමෙහි බලපෑමට ලක්ව දිවි ගලවා ගත්තවුන්ට පොදු සෞඛ්‍ය සේවා ලබා දීමේ වැඩසටහනක් සෞඛ්‍ය අමාත්‍යංශයෙන් සිදු කරන බවක් නොපෙනේ.[122] එහෙත් එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ජාලය දැනටමත් අමාත්‍යංශය සතුව ඇති බැවින් එවැනි වැඩසටහනක් අධීක්ෂණය කිරීමේ හැකියාව අමාත්‍යාංශයට තිබේ. හැකිතාක් ඉක්මණින් සේවා සැපයීමට හැකි වන අයුරින් ඉක්මණින් පියවර ගත යුතු ය. උපදේශනය හෝ කුසලතා පුහුණුව වැනි සේවා හෝ සහය ලබා දීම සඳහා සිවිල් සමාජයෙන් ලැබෙන උපකාර පිළිගත යුතු ය.

කාන්තා පිරිමි දෙපාර්ශ්වයට සඳහා ම ඔවුන්ට ගැලපෙන පරිදි සකස් කළ පුනරුත්ථාපන වැඩසටහන් සකසන බවට වගබලා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් කාන්තාවන්ට සහ පිරිමින්ට ඇති වන ආවේණික බලපෑම් හඳුනාගැනීම සඳහා පුහුණු කරන ලද, ද්‍රවිඩ සහ සිංහල භාෂා හැසිරවිය හැකි කාන්තා පිරිමි දෙපාර්ශ්වයේ ම මනෝ විද්‍යාඥයන් සිටිය යුතු ය. අධ්‍යාපනය සහ රැකියා පුහුණුව ප්‍රායෝගික විය යුතු අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ විෂමතා සවිමත් නොකළ යුතු ය. නිදසුනක් ලෙස, රාජ්‍ය නොවන සංවිධාන මගින් මීට පෙර සිදු කළ වැඩසටහන්වල දී ඇඳුම් සහ රෙදිපිළි නිෂ්පාදන සඳහා එතරම් ඉල්ලුමක් නොමැති ප්‍රදේශයක ජීවත් වන කාන්තා වින්දිතයන්ට මහන මැෂින් ලබා දීම.[123] ඒ හේතුවෙන් එම වැඩසටහන මගින් වින්දිතයන්ගේ ජීවනෝපාය තත්ත්වය වැඩි දියුණු කිරීමට එතරම් උපකාරයක් නොලැබුණි.

### සෑහීමකට පත් කිරීම (Satisfaction)

ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීම අනුස්මරණීකරණය සහ සත්‍යය සෙවීම සෑහීමකට පත් කිරීමට ඇතුළත් වේ. සෑහීමකට පත් කිරීම සඳහා සිදු කරන ක්‍රියාවන් මගින් තව දුරටත් අපකීර්තියක් සහ හානියක් සිදු නොවන බවට වගබලා ගැනීම සඳහා එම යාන්ත්‍රණයන් සැලසුම් කිරීමේ දී වින්දිතයන්ගේ අදහස් විමසිය යුතු ය. අධිකරණ තීන්දු ඔස්සේ හෝ සත්‍යය සහ ප්‍රතිසන්ධාන වාර්තා මගින් හෝ රජයේ ප්‍රකාශ මගින් ප්‍රසිද්ධියේ සිදු කරන පිළිගැනීම් වින්දිතයන්ට විශේෂයෙන් වැදගත් වන බව පෙනී ගොස් ඇත. රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයෙන් තමන්ට අවශ්‍ය කුමක්දැයි ඇසූ විට රුවන්ඩාවේ කාන්තාවන් පවසා තිබුණේ "තමන් අත්දුටු දේ අධිකරණය විසින් පිළිගැනීම සහ තමන්ට එරෙහිව සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා අධිකරණය විසින් හෙළා දැකීම" යනුවෙනි.[124] පුනරුත්ථාපනය සහ සංක්‍රාන්තික ක්‍රියාවලිය සඳහා ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීම සහ පිළිගැනීම වැදගත් වනු ඇති බව ශ්‍රී ලංකාවේ උතුරේ සහ නැගෙනහිර වින්දිතයන් කණ්ඩායම් සහ සිවිල් සමාජය සඳහන් කර ඇත.[125] 2015 පෙබරවාරි 4 වනදා සිදු කළ සාම ප්‍රකාශය කළ අයුරින් රජය විසින් එවැනි සමාව ඉල්ලීමක් සිදු කළ හැකි ය. එහෙත් සමාව ඉල්ලීමට සමගාමීව අධිකරණමය වගවීම, ආරක්ෂක අංශයේ සහ ආයතනික සංශෝධන වැනි සෙසු පියවර ද ගත යුතු බව හඳුනා ගැනීම වැදගත් වේ. එසේ නොකළහොත් සංක්‍රාන්තික ක්‍රියාවලිය පිළිබඳව විශ්වාසයක් නොමැති වීම නිසා සමාව ඉල්ලීමෙහි අර්ථය සීමා වනු ඇත.

සත්‍යය පිළිගැනීමේ දී කාන්තා සහ පිරිමි දෙපාර්ශ්වයේ ම වින්දිතයන් අපකීර්තියට ලක් වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. කාන්තාවන් මෙන් ම පිරිමින් ද ලිංගික අපචාරයන්ට ලක් වීම පිළිගත යුතු අතර එසේ කළ යුත්තේ වින්දිතයන් තව දුරටත් නෙරපනු ලැබීමක් සිදු නොවන අයුරිනි. පිරිමි වින්දිතයන්

---

122 http://www.health.gov.lk/

123 නිම්මි ගෞරිනාදන් සහ කේට් ක්‍රොනින් ෆර්මන්, ඉහත 109 සටහන

124 බිනයිෆර් නව්රොජි "ඔබේ යුක්තිය ඉතා මන්දගාමීයි" රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය මගින් රුවන්ඩාවේ දූෂණ වින්දිතයන්ට අනර්ථයක් කරයිද? (“Your Justice is Too Slow” Will the ICTR Fail Rwanda’s Rape Victims?), (2005 නොවැම්බර්) පිටුව 6

125 ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි

සම්බන්ධයෙන් ප්‍රජාව තුළ ඇති අවබෝධය අදහස් වෙනස් කිරීමට ප්‍රයත්න දැරිය යුතු ය. ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වන පිරිමි වින්දිතයන් නිතර ම මානසික අවපීඩනය, අවපීඩනය සහ ආත්ම සම්මානනය පහළ යාම හේතුවෙන් ලිංගිකව අක්‍රිය වීම, පවුල් සම්බන්ධතා පළුදු වීම, සහ ප්‍රජාව තුළ කොන් වීමට ලක් වීම සිදු වේ.[126] ඔවුන්ට සාමාන්‍යයෙන් සංවිධානවල සහය නොලැබෙන අතර, ඔවුන් සඳහා ප්‍රමාණවත් ලෙස සකස් කළ සේවා ද නොලැබේ.[127] සැහීමකට පත් කිරීම සඳහා ගනු ලබන ඕනෑම ක්‍රියාවක දී පිරිමි වින්දිතයන්ව සාමූහික සහ රහස්‍යභාවය රැකෙන අයුරින් පිළිගත යුතු අතර, පුරුෂත්වය අවප්‍රමාණ නොකරන හෝ වෙනත් අයුරකින් ඔවුන් අපකීර්තියට ලක් නොකරන භාෂාවක් ඒ සඳහා යොදා ගත යුතු ය.

නැවත සිදුනොවන බවට සහතික වීම

නැවත සිදුනොවන බවට සහතික වීම වින්දිතයන්ට සංකේතාත්මක වශයෙන් විසඳුමක් ලබා දීමේ වැදගත් පියවරක් විය හැකි අතර ම, පශ්චාත් ගැටුම් සමයේ සංක්‍රාන්තියට පහසුකම් සැලසීම සඳහා ද එය ප්‍රබල ක්‍රමයක් වේ. ඵලදායී ලෙස විශ්වාසය ගොඩ නැගීමට නම්, නැවත සිදු නොවන බවට සහතික වීමට සමගාමීව ආයතනික ප්‍රතිසංස්කරණ, විශ්වසනීය අධිකරණ පද්ධතියක්, සහ සත්‍යය සෙවීමේ සාර්ථක ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක කළ යුතු ය.[128] අනාගතයේ දී ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වීම වැළැක්වීමේ ප්‍රතිපත්තියක් සහ වගවීම නොකඩවා සිදු වන බවට සහතික වීම ක්‍රියාවට නැංවිය යුතු ය.[129] "ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මනාව ස්ථාපිත කිසිසේත්ම නොඉවසීමේ ප්‍රතිපත්තියක් (zero tolerance) ඇති බවත්", "වාර්තා වන සිද්ධි සම්බන්ධයෙන් ප්‍රබල ක්‍රියාමාර්ග ගැනීම දිගට ම සිදු කරන බවත්" ශ්‍රී ලංකා රජය නැවත නැවතත් සඳහන් කර ඇත.[130] හමුදාවේ පොලීසියේ සහ වෙනත් පුද්ගලයන් සඳහා අධ්‍යාපනය සහ වගවීම මගින් රජය මෙම ප්‍රකාශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. "නැවත සිදුනොවන බවට සහතික වීම සවිමත් කිරීම සඳහා එවැනි ආයතනික පිළියම් ප්‍රබල යාන්ත්‍රණයකි".[131] ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා සම්මතයේ 8 වන ඡේදයේ ඇතුළත් වේ. එමගින් "සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන් ආරක්ෂක

---

[126] ක්‍රිස් ඩොලාන්, ප්‍රධාන ධාරාවට: පිරිමින් සහ පිරිමි ළමුන්ට සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වයට පිළියම් යෙදීම (Into the Mainstream: Addressing Sexual Violence Against Men and Boys) (3-4) (2014), මෙතැනින් බලන්න: http://www.refugeelawproject.org/files/briefing_papers/Into_The_Mainstream-Addressing_Sexual_Violence_against_Men_and_Boys_in_Conflict.pdf

[127] *එහි ම පිටුව 4;* Fionnuala, *ඉහත 104* සටහන පිටුව 109

[128] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි) පිටුව 19-20

[129] *එහිම* පිටුව 20

[130] කලම්බු ටෙලිග්‍රාෆ්, ආරක්ෂක හමුද විසින් විරුද්ධවාදීන්ට එරෙහිව ස්ත්‍රී දූෂණය යොදා ගැනීම දිගටම සිදු වන බවට කැනඩාව කරන චෝදනා ශ්‍රී ලංකාව ප්‍රතික්ෂේප කරයි (Sri Lanka Rejects Canada's Claim 'Ongoing Use Of Rape Against Opponents By Security Forces), (2014 ජුනි 23), මෙතැනින් බලන්න: https://www.colombotelegraph.com/index.php/sri-lanka-rejects-canadas-claim-ongoing-use-of-rape-against-opponents-by-security-forces/

[131] Fionnuala, *ඉහත 104* සටහන පිටු 116-117 (ඒ.එස්. එදිරිව හන්ගේරියාව නඩුව උධෘත කර ඇත. මෙම නඩුවේ දී බලහත්කාරයෙන් වන්ධ්‍යකරණයට ලක් කරනු ලැබූ වින්දිතයෙකුට අධිකරණය විසින් වන්දි ප්‍රදානය කරන ලද අතර මින් ඉදිරියේ දී සෞඛ්‍ය සේවකයන් විසින් අදාළ පුද්ගලයාට කරුණු පැහැදිලි කර දී කැමැත්ත ලබාගන්නා බවට රජය වගබලාගත යුතු බවට ආයතනික වෙනසක් ලිඛිතව ඇති කරන ලෙස අධිකරණය විසින් නියෝග කරන ලදී.)

අංශයට එළදයී ප්‍රතිසංස්කරණ සිදු කිරීමට ශ්‍රී ලංකා රජය උනන්දු කරනු ලැබේ."[132] යෝජනා සම්මතයෙන් යෝජනා කර ඇති පරිදි මානව හිමිකම් උල්ලංඝනය කර ඇති පුද්ගලයන් වත්මන් ආරක්ෂක අංශවලට ඇතුළත් වීම වැළැක්වීම සඳහා පරිපාලනමය ක්‍රියාවලියක් හඳුන්වා දීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුවක් සහ දිරිදීමනාවක් ලබා දීම ආදිය ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණවලට ඇතුළත් විය හැකි ය.[133] කෙසේ වුව ද, බලපෑමක් කළ හැකි ප්‍රතිසංස්කරණ සැලසුම් කිරීම සඳහා වින්දිතයන් සහ සිවිල් සමාජය ද සහභාගි විය යුතු ය. ආරක්ෂක හමුදා සහ අධිකරණ පද්ධතිය තුළ කාන්තාවන් තනතුරු දරන බවට වගබලා ගැනීම වැනි වෙනස්කම් මගින් යුක්තිය සොයා යාමට අවශ්‍ය කාන්තා වින්දිතයන්ගේ තත්ත්වය වැඩි දියුණු වී, වගවීම සහ නැවත සිදු නොවීම වඩාත් හොඳින් තහවුරු වේ. සියෙරා ලියෝන්හි පවුල් සහය ඒකක ඇති කිරීම ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණයක් සාර්ථකව සිදු වූ අවස්ථාවකට නිදසුනකි. ලිංගික ප්‍රචණ්ඩත්වය, ගෘහස්ථ හිංසනය සහ කුට්ටනය (trafficking) සම්බන්ධයෙන් පුහුණුව ලැබූ නිලධාරීන්ගෙන් මෙම ඒකක සමන්විත විය.[134] ප්‍රජාවගේ විශ්වාසය දිනා ගැනීමට පවුල් සහය ඒකකවලට හැකි වීම නිසා සිද්ධි පිළිබඳ වාර්තා වීම ඉහළ ගිය අතර අපකීර්තියට පත් වීමෙහි අඩුවක් සිදු විය.[135] දණ්ඩන මුක්තියේ සංස්කෘතිය වෙනස් කරන බවට පණිවිඩයක් ලබා දීම සඳහා, ජාත්‍යන්තර නීතිය දේශීය නීතියට අන්තර්ගත කිරීම වැනි ව්‍යවස්ථාදයක ප්‍රතිසංස්කරණ සමග අධිකරණමය වගවීම තහවුරු කිරීම අවශ්‍ය වේ. එසේ ම ගැටුමට මුල් වූ හේතු සහ විසඳුම් හඳුනා ගනු ලබන සත්‍යය පැවසීමේ ක්‍රියාවලියක් මගින් ද නැවත සිදු නොවන බවට සහතිකය පිළිබඳව විශ්වාසය තව දුරටත් ආරක්ෂා වනු ඇත.

**සාමූහික හානි පූරණය**

වින්දිතයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහ සේවා ලබා ගැනීම සඳහා නොපෙළඹෙන වින්දිතයන් වෙත එළඹීම සඳහා සාමූහික හානි පූරණය යොදා ගත යුතු ය.[136] පුනරුත්ථාපනමය හෝ වෙනත් හානි පූරණ ලබා ගැනීමට යාමේ දී තමන්ට සිදු වූ දේ නැවත පැවසීමට හෝ තමන් වින්දිතයන් බව හෙළි කිරීමට සිදු වුවහොත් එමගින් තමන් අපකීර්තියට පත් වීමේ සැබෑ අවදානමක් ඇති බැවින් බොහොමයක් වින්දිතයෝ එවැනි සේවා සඳහා ප්‍රවේශ නොවෙති. උපදේශනය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපන සේවා වැනි හානි පූරණ ප්‍රජාවට ම සාමූහිකව ලබා දීමෙන් මෙම ගැටලුව ජය ගැනීමට හැකි වේ. කෙසේ වුව ද එම සේවා සපයන්නන් ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා ඇති බවට වගබලාගත යුතු ය. ඊට අමතරව, සාමූහික මට්ටමෙන් ගනු ලබන පියවර තනි පුද්ගලයන්ට ලබා දෙන විසඳුම්වලට ආදේශකයක් ලෙස නොව එම විසඳුම්වලට අමතරව පවතින්නක් විය යුතු අතර එය නැවතත් හුදෙක් යටිතල පහසුකම් ගොඩ නැගීමට පමණක් වෙන් නොකළ යුතු ය.[137] ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීම වැනි සංකේතාත්මක පියවර ද සෑම විට ම සාමූහික විය යුතු අතර, තනි තනි වින්දිතයන් හඳුනා ගැනීමක් සිදු නොවිය යුතු ය.

**අතුරු හානි පූරණ**

---

[132] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම: යෝජනා සම්මතය/ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගන්නා ලදී, A/HRC/30/L.29 *ඉහත* 14 සටහන 8 පිටුව

[133] *එහිම*

[134] මේගන් බැස්ටික් සහ ඩැනියෙල් ඩි ටෝරස්, ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණවල දී කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ යෝජනා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම, මෙතැනින් බලන්න: http://www.osce.org/odihr/75269?download=true

[135] *එහිම* 13 පිටුව

[136] රුබියෝ-මැරින්, *ඉහත* 15 සටහන 97 පිටුව

[137] *එහිම*. 104 පිටුව

හානි පූරණ වැඩසටහනක් සැකසීම සඳහා සැලකිය යුතු තරමේ සැලසුම් කිරීමක් අවශ්‍ය වන බැවින් ඒ සඳහා සාමාන්‍යයෙන් දිගු කාලයක් ගත වේ. කෙසේ වුව ද, ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවල බලපෑම එම ක්‍රියා සිදු වූ අවස්ථාවේ සිට ම පවතින අතර එම බලපෑම බරපතළ වේ (immediate and serious). සෞඛ්‍ය සහ මනෝ විද්‍යාත්මක ගැටලු වැනි හදිසි ඵලවිපාකවලින් පීඩා විඳින වින්දිතයන් සඳහා අතුරු හානි පූරණ ලබා දිය යුතු ය. ප්‍රචණ්ඩත්වය සහ අවතැන්වීම සමස්ත ප්‍රජාවන්ගේ සංස්කෘතික හර පද්ධතීන්වලට බරපතල ලෙස බලපා ඇති ශ්‍රී ලංකාවේ මනෝ සමාජයීය සහය ලබා දීමේ අවශ්‍යතාවක් විශේෂයෙන් පවතින නිසා මේ අතරමැදි පියවරක් ලෙස එයට ද පිළියම් කළ යුතු ය.[138] ස්ත්‍රී දූෂණය හේතුවෙන් ගැබ්ණි තත්ත්වයට පත් වූ වින්දිතයන් වැනි සමහර වින්දිතයන්ට ඉක්මණින් මනෝ විද්‍යාත්මක සහය ලබා දීම විශේෂයෙන් අවශ්‍ය වේ.[139] මෙවැනි වින්දිතයන්ට ඔවුන්ට ම ආවේණික වූ අභියෝගවලින් පීඩා විඳීමට සිදු වේ. එනම්; ශාරීරික සහ මානසික හානිවලට අමතරව මෙවැනි වින්දිතයන්ට සමහර අවස්ථාවල තනිකමක් සහ කොන් වුණු බවක් ද දැනීමෙන් ඔවුන් ප්‍රමාණවත් ලෙස රැකබලා ගැනීමක් සිදු නොවන බැවිනි. ඔවුන්ගේ අවශ්‍යතාවලට උපකාරී කිරීම සහ සමාජයෙන් ඇත් කරනු ලැබීමේ අභියෝග ජයගැනීම සඳහා සැකසූ සුදුසු මනෝ සමාජයීය සහය පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතු ය. සේවා ලබා ගැනීමට පැමිණීම සඳහා වින්දිතයන් දක්වන පසුබෑම සලකන විට නිර්මාණාත්මක වැඩසටහන් සහ රහස්‍යභාවය සහතික කිරීම අතුරු මනෝ සමාජයීය සහය සඳහා අවශ්‍ය වේ. මනෝ සමාජයීය බලපෑමෙන් දිගින් දිගට ම පීඩා විඳින වින්දිතයන් සිටී නම් ඔවුන්ට සෞඛ්‍ය සේවා ද ලබා දිය යුතු ය. ශ්‍රී ලංකාවේ සමහර වින්දිතයන්ට "මුහුණ දුන් වධහිංසා හේතුවෙන් ශල්‍ය කර්ම ඇතුළු වෛද්‍ය ප්‍රතිකාර" අවශ්‍ය වන අතර තවත් සමහර වින්දිතයන්ට ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වැළඳී ඇත්දැයි බැලීමට පරීක්ෂණවලට මුහුණ දීමට හෝ ප්‍රසව හා නාරිවේද ප්‍රතිකාර අවශ්‍ය වන බව වාර්තාවල දැක්වේ.[140] වන්දියක් ගෙවන ලෙස අපරාධකරුවන්ට නියෝග කරනු ලබන අවස්ථාවල එය ගෙවනු ලබන්නේ කලාතුරකිනි; එසේත් නැත්නම් කොටසක් ගෙවීම හෝ ගෙවීම ප්‍රමාද කිරීම සිදු වේ.[141] රජය විසින් වන්දි ප්‍රදානය ක්‍රියාත්මක කළ යුතු අතර වින්දිතයන්ට හැකි ඉක්මණින් වන්දි ලැබෙන පරිදි එම වන්දි ප්‍රදාන ඍජුව සිදු කළ යුතු ය. හානි පූරණය ප්‍රමාද වන විට ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවල බලපෑම දෙගුණ තෙගුණ වී ප්‍රජාව තුළ වින්දිතයා ආර්ථිකමය සහ සමාජමය වශයෙන් කොන් වීම තවත් නරක අතට හැරේ.[142] රජය විසින් හානි පූරණ ප්‍රතිපත්තියෙහි හෝ කෙටුම්පතෙහි අතුරු හානි පූරණ පිළිබඳව ද කොටසක් අන්තර්ගත කළ යුතු අතර වෙන ම අතුරු හානි පූරණ ප්‍රතිපත්තියක් හැකි ඉක්මණින් ක්‍රියාවෙහි යෙදවිය යුතු ය. ඉක්මණින් හානි පූරණ ලබා දිය යුතු වින්දිතයන් හඳුනා ගන්නේ කෙසේද වැනි ගැටලු මෙම ප්‍රතිපත්තිය මගින් පැහැදිලි කළ යුතු ය. දකුණු අප්‍රිකාවේ "හදිසි අතුරු හානි පූරණ පියවර පිළිබඳ ප්‍රතිපත්ති රාමුව" ආදර්ශකයක් වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි ය.[143] හැකි සෑම විට ම සෞඛ්‍ය සහ වෙනත් අවශ්‍යතා සේවා ලබා දීම සඳහා සිවිල් සමාජ කණ්ඩායම් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය වැනි අදාළ රජයේ ආයතන ක්‍රියා කළ යුතු ය. අතුරු හානි පූරණ කටයුතු සිදු කිරීම මගින් වින්දිත ප්‍රජාවන්ට ඇති වන දිගු කාලීන හාණිකර බලපෑම අඩු කර ගත හැකි වුව ද එය අතුරු කාල සීමාවෙන් පසුව සිදු කළ යුතු කටයුතුවලට විකල්පයක් නොවේ.

**ක්‍රියාත්මක කිරීම**

---

[138] සුසානා හර්ඩ්ලිකෝවා, ශ්‍රී ලංකාවේ පවතින ගැටුම කාන්තාවන්ගේ සමාජ තත්ත්වයට කර ඇති බලපෑම (The Impact of the Sri Lankan Conflict on the Social Status of Women), මෙතැනින් බලන්න: http://www.academia.edu/11372215/The_Impact_of_the_Sri_Lankan_Conflict_on_the_Social_Status_of_Tamil_Women

[139] උතුරේ දී සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි 23

[140] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන 11* පිටුව

[141] කොළඹ දී සිදු කළ සම්මුඛ සාකච්ඡාව, 2016 ජනවාරි 24

[142] Fionnuala, *ඉහත 104* සටහන පිටු 119-120

[143] හදිසි අතුරු හානි පූරණ පියවර සඳහා දකුණු අප්‍රිකාවේ ප්‍රතිපත්ති රාමුව 1995, මෙතැනින් බලන්න: http://www.justice.gov.za/trc/reparations/policy.htm

වින්දිතයන් කැමැත්තෙන් හානි පූරණ ඉල්ලා සිටින අතර ම, ඔවුන්ට හානි පූරණ ඉල්ලා සිටීමට හැකියාව ඇති, එමෙන් ම අතිරේක හානියක් ඇති නොකරන බවට වග බලාගන්නා ඵලදායී හානි පූරණ වැඩසටහනක් සැලසුම් කිරීම සඳහා අදළ වන කරුණු රැසක් ඇත. ශ්‍රී ලංකාවේ හානි පූරණ වැඩසටහනකට සහභාගී වන්නන්ගේ ආරක්ෂාව සහ රහසිගතභාවය සහතික කිරීම සඳහා සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ ප්‍රමාණවත් වැඩපිළිවෙලක් අත්‍යවශ්‍ය වේ. හානි පූරණයට ප්‍රවේශ වන අයට පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය තිබිය යුතු ය. සිය ප්‍රජාවේ අපකීර්තියට ලක් වීමේ අවදානමක් නොමැතිව පිළියම් පතා පැමිණීමට ඔවුන්ට හැකි වන්නේ එවිට ය. සාධන සම්මතය (Standards of proof) සහ සාක්ෂි එක්රැස් කිරීමේ ක්‍රියාවලියේ දී සාක්ෂි ලබා ගැනීමේ දී පවතින සීමාවන් සහ සහභාගී වීමේදී වින්දිතයන්ට ඇති වන මානසික බලපෑම සැලකිල්ලට ගත යුතු ය. අවසන් වශයෙන්, ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන විවිධ ප්‍රායෝගික බාධක ප්‍රවේශමෙන් සැලකිල්ලට ගත යුතු ය.

හානි පූරණ ලබා ගැනීම සඳහා පැමිණෙන වින්දිතයන්ගේ රහස්‍යභාවය සහ ආරක්ෂාව සුරැකීම අවශ්‍ය වේ. තමන්ගෙන් සහ පවුලේ අයගෙන් පළි ගනිතැයි යන සාධාරණ බිය බොහෝ වින්දිතයන් තුළ තිබේ.[144] වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරැකීමේ පනත සංශෝධනය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් (ජාතික අධිකාරිය) 2016 ජනවාරි 8 වනදා පිහිටවන ලදී[145]. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අනෙකුත් දෙපාර්තමේන්තු සහ ආයතනවලට අනිවාර්යයෙන් නොබැඳෙන (non-binding) නිර්දේශ ලබා දීමට මෙම අධිකාරියට බලය ඇත. එහෙත් මෙමගින් ලැබෙන ආරක්ෂාව ප්‍රමාණවත් වන බවටත් අධිකාරියට පත් කරනු ලබන සාමාජිකයන් සැබැවින් ම ස්වාධීන පුද්ගලයන් වන බවටත් සහතික වීම සඳහා වැඩිදුර පියවර ගත යුතු ය. ජාතික අධිකාරිය දැනට සැකසී ඇත්තේ හිටපු අමාත්‍යංශ නිලධාරීන් හත් දෙනෙකුගෙන් සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙනි.[146] පනතට අනුව, අධිකාරියේ මාර්ගෝපදේශකවලට අනුකූලව වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහය වීමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙන් ම, තර්ජනය කිරීම් හෝ පනත උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද වගකිව යුතු කොට්ඨාසයක් තිබේ.[147] කෙසේ වුව ද, මෙම කොට්ඨාසයේ ප්‍රධානියා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකි.[148] සමහර නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් ද විමර්ශනය කිරීමට සිදු වීමට ඉඩ ඇති සහ සිදු කළ යුතු බැවින් මෙම ව්‍යුහය ඵලදායී නොවේ. ව්‍යවස්ථාදායකය විසින් මෙම පනත සංශෝධනය කළ යුතු අතර, හමුදාවට හෝ පොලීසියට සම්බන්ධයක් නොමැති ස්වාධීන සාමාජිකයන් ජාතික අධිකාරියට පත් කිරීමට රජය වග බලාගත යුතු ය. එමෙන් ම ඉහත කී කොට්ඨාසය පොලිස් දෙපාර්තමේන්තුවෙන් සම්පූර්ණයෙන් ම වෙන් කළ යුතු ය.[149] වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් වගකියන ස්වාධීන ඒකකයක් සෑම සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයක් ම සතු විය යුතු ය.

වින්දිතයන් සිය ප්‍රජාවෙන් සහ පවුලෙන් අපකීර්තියට ලක් වීමෙන් සහ සමාජයෙන් නෙරපනු ලැබීමෙන් ආරක්ෂා කිරීම සඳහා මෙන් ම ඔවුන්ගේ සහභාගිත්වයට පහසුකම් සැලසීම සඳහා රහස්‍යභාවය සුරැකීම ඉතා වැදගත් වේ.[150] ශ්‍රී ලංකාවේ කාන්තාවකගේ කුමරි බඹසර සහ පිරිසිදුකම ඇයට විවාහ වීමට ඇති

---

144 ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන*

145 සිලෝන් ටුඩේ, NA for protecting victims and witnesses set up, (2016 ජනවාරි 8), මෙතැනින් බලන්න http://www.ceylontoday.lk/51-114488-news-detail-na-for-protecting-victims-and-witnesses-set-up.html

146 *එහිම*

147 *එහිම*

148 *එහිම*

149 *එහිම*

150 *Fionnuala*, *ඉහත 104* සටහන පිටුව 99; සුසානා හර්ඩ්ලිකෝවා, *ඉහත* 138 සටහන පිටුව 84

හැකියාව සහ සමාජ තත්ත්වය සමග බැඳී පවතී.[151] කාන්තාවකගේ අකැමැත්තෙන් වුව ද ඇයගේ කන්‍යාභාවය අහිමි වුවහොත් ඇයට විවාහ වීමට ඇති ප්‍රවේශයත්, ඒ ඔස්සේ ආර්ථික වශයෙන් ස්ථාවර වීමට ඇති අවස්ථාවත් අහිමි වේ.[152] විවාහක කාන්තාවක වින්දිතයෙකු ලෙස හඳුනාගනු ලැබුවහොත් එය ඇගේ සැමියාට අවමානයක් සහ ඔහුගේ පිරිමිකමට නින්දවක් වීමට සහ ඇගේ දරුවන් අපකීර්තියට පත් වීමට හේතු වනු ඇත.[153] මුළු පවුලට ම බරපතළ ඵලවිපාකවලට මුහුණ දීමට සිදු වන අතර පවුලේ අය විසින් වින්දිතයා අතහැර දැමීමට පවා ඉඩ තිබේ. "ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ප්‍රජාව අතර ලජ්ජාවට ලක් වීමේ සංස්කෘතිය කොතරම් අන්තයට ගොස් ඇත්ද යත් තමන් රැඳවුම් භාරයෙන් නිදහස ලැබූ පසුව ළමා කල පටන් සිටි සමීපතම මිතුරියන් පවා ගමේ දී තමන් මග හැරි අයුරු සාක්ෂිකාරියෝ විස්තර කළ හ. ලන්ඩන් නුවර සිටි සිය ඥාතීන්ට ඒ පිළිබඳව කීමට එක් එල්.ටී.ටී.ඊ. සාමාජිකාවක් බිය වූයේ එසේ කළහොත් ඔවුන් තමන් නිවසින් පිටතට දමනු ඇතැයි ඇය බිය වූ නිසා ය."[154] පිරිමි පුද්ගලයෙකු ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවක වින්දිතයෙකු බවට හඳුනා ගනු ලැබුවහොත් එය ඔහුට අවනම්බුවක් වන අතර ඔහුගේ පිරිමිකමේ ප්‍රබලත්වය අඩු වීමක් සිදු වේ.[155] තමන් දුර්වලයන්, ගැහැණුගති ඇත්තවුන් හෝ සමලිංගිකයන් ලෙස සලකනු ඇතැයි පිරිමි වින්දිතයෝ බිය වෙති.[156] වින්දිතයන් ලෙස හඳුනා ගැනීමත් සමග ඇති වන අධික අපකීර්තිය හේතුවෙන් එසේ විපතකට මුහුණ දී දිවි ගලවාගත්තවුන් "හානි පූරණ ඉල්ලා සිටීමට වැඩිපුර පෙළඹෙන්නේ ඔවුන්ගේ රහස්‍යභාවය රැකෙන්නේ නම් පමණි"[157] "පෞද්ගලිකව, දුරක සිට හෝ නියෝජිතයෙකු මගින් සාක්ෂි දීමට" වින්දිතයන්ට ඉඩ දීමෙන් රහස්‍යභාවය සහතික කළ යුතු ය.[158] රහස්‍යභාවය ආරක්ෂා නොවන බවක් පෙනෙන්නේ නම් හෝ හානි පූරණයක් ලැබේදැයි අවිනිශ්චිත නම් වින්දිතයන්ට ඒ බව හෙළි කළ යුතු ය. එවිට ඔවුන්ට සැබෑ තත්ත්වය දැනගෙන වැඩසටහනට සහභාගි වන්නේ ද නැද්ද යන්න පිළිබඳව තීරණය කළ හැකි වේ.[159] අපකීර්තියට පත් වීම ඉලක්ක කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හානි පූරණය සඳහා වූ කාර්යාලය සහ සිවිල් සමාජ කණ්ඩායම් එක්ව කටයුතු කළ යුතු ය. සමහර අධ්‍යාපනික සහ මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාර දැනටමත් ක්‍රියාත්මක වුව

---

[151] සුසානා හර්ඩ්ලිකෝවා, *ඉහත* 138 සටහන; දිනුක් කොළඹගේ, *ඉහත* 2 සටහන ("ශ්‍රී ලංකාවේ සංස්කෘතික සම්මතයන් හේතුවෙන් ලිංගික අපචාරයන්ට ලක් වූ වින්දිතයන් එම අපරාධ පිළිබඳව පැමිණිලි කිරීමට අකැමැත්තක් දක්වනවා." කොළඹ සරසවියේ ඉගැන්වීම් කරන ප්‍රනාන්දු පැවසුවා ය. "බොහෝ අවස්ථාවල එවැනි ක්‍රියාවක් පිළිබඳව දැන ගැනීමට ලැබුණු විට කාන්තාවක් ඇය ජීවත් වන ප්‍රජාව විසින් මග හරිනු ලබනවා." ඇය පැවසුවා ය. "කාන්තාවක් විවාහ වී නොමැති නම් මෙවැනි දෙයක් ප්‍රසිද්ධ වුණොත් ඇයට සැමියෙකු සොයා ගැනීම සෑහෙන අපහසු වනු ඇති")

[152] සුසානා හර්ඩ්ලිකෝවා, *ඉහත* 138 සටහන

[153] ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි

[154] ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සත්‍ය සහ යුක්ති ව්‍යාපෘතිය, "නිහඬ කරවූවන්", *ඉහත 1 සටහන 35* පිටුව (Witness 177)

[155] ද ලැන්සට්, ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ සිරකරුවන් ලිංගික අපයෝජනයට ලක් කිරීම පිළිබඳ ද ලැන්සට් වාර්තාව (The Lancet on Sexual Abuse of Tamil Prisoners in Sri Lanka), (2000 ජුනි), මෙතැනින් බලන්නඃ http://www.sangam.org/ANALYSIS/Lancet.htm

[156] Maite Vermeulen, සැඟවුණු වින්දිතයන්ඃ සන්නද්ධ ගැටුමක දී පිරිමින්ට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩත්වය සිදුවීමේ කතන්දරය (Hidden Victims: The Story of Sexual Violence Against Men in Armed Conflict) (2011 සැප්තැම්බර් 4), මෙතැනින් බලන්නඃ http://www.e-ir.info/2011/09/04/hidden-victims-the-story-of-sexual-violence-against-men-in-armed-conflict/

[157] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි)

[158] රූබියෝ-මැරින්, *ඉහත 15 සටහන* 80 පිටුව

[159] Fionnuala, *ඉහත 104* සටහන පිටුව 139; බිනයිෆර් නව්රොජ් "ඔබේ යුක්තිය ඉතා මන්දගාමීයි" රුවන්ඩාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණය මගින් රුවන්ඩාවේ ස්ත්‍රී දූෂණ වින්දිතයන්ට අනර්ථයක් කරයිද? ("Your Justice is Too Slow" Will the ICTR Fail Rwanda's Rape Victims?), (2005 නොවැම්බර්) පිටුව 22

ද.[160] පිරිමින් සහ කාන්තාවන් යන දෙපාර්ශ්වයට ම සිදුවන අපකීර්තිය මැඩලීම සඳහා තවත් බොහෝ දෑ සිදු කළ යුතු ය. බොහෝ දෙනෙකු වෙත ළඟා විය හැකි නවීන එළඹුම් යොදා ගැනීම සළකා බැලිය යුතු ය. නිදසුනක් ලෙස, දුරකථනයෙන් අමතා ප්‍රශ්න ඇසීමට ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන්ට හැකි ගුවන් විදුලි වැඩසටහනක් කාම්බෝජියාවේ නිර්මාණය කරන ලදී.[161] අනන්‍යතාව හෙළි නොකර සිය අත්දැකීම් පිළිබඳව කතා කර තොරතුරු දැනගැනීමට වින්දිතයන්ට මෙමගින් හැකි විය. එසේ ම ලිංගික ප්‍රචණ්ඩත්වය යන ගැටලුව සමාජය තුළ වඩාත් දෘශ්‍යමාන කිරීම මගින් අපකීර්තිය සඳහා ද පිළියම් කිරීමට වැඩසටහන මගින් හැකි විය.

පැමිණිලි කිරීම සීමාසහිත වීම, අපකීර්තිය සහ බිය වැනි කරුණු හේතුවෙන් සාක්ෂි තක්සේරු කිරීම දුෂ්කර වීම නිසා හානි පූරණ ප්‍රදානය සඳහා අවශ්‍ය සාධන සම්මතය පහත දැමිය යුතු ය.[162] සාක්ෂි එක්රැස් කිරීමේ ක්‍රමවේද වින්දිතයන් කෙරෙහි සංවේදී විය යුතු අතර, ඔවුන් නැවත වරක් කම්පනයට ලක් වීම වැළකෙන අයුරින් ඒවා සැලසුම් කළ යුතු ය. නිදසුනක් ලෙස, කාන්තා වින්දිතයන්ට කාන්තාවක් විසින් සහ පිරිමි වින්දිතයන්ට පිරිමියෙකු විසින් වෛද්‍ය පරීක්ෂණ සිදු කරන්නැයි ඉල්ලා සිටීමට සහ සිය අත්දැකීම් පෞද්ගලිකව පැවසීමට අවස්ථාව ලබා දිය යුතු ය. වින්දිතයන්ට සිය අත්දැකීම් පැවසීමේ දී සංකේතමය හෝ ප්‍රජාවට සුවිශේෂී වූ භාෂාවක් භාවිත කිරීමට හැකි විය යුතු ය. ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව විස්තරාත්මකව පැවසීමේ දී තහංචියක් ඇතිවීම සහ කම්පනයට පත්වීම වැළැක්වීමට එමගින් හැකි වේ.[163]

ආර්ථික, භූගෝලීය, සාක්ෂරතාමය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අදළ බාධක කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. අභ්‍යන්තරව අවතැන් වී සිටින්නන් සිටින ස්ථාන සොයා ගැනීම අසීරු විය හැකි අතර, තොරතුරු සහ සම්පත්වලට පහසුවෙන් ප්‍රවේශ වීමට ඔවුන්ට නොහැකි විය හැකි ය. තමන්ට හිමි හානි පූරණ සඳහා ප්‍රවේශ වීමෙහි ලා කාන්තාවන්ට විශේෂයෙන් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වේ.[164] ද්‍රවිඩ ප්‍රජාවන් තුළ කාන්තාවන් ආරක්ෂා වීම පිණිස නිවෙස් තුළට ම වී සිටීමේ ප්‍රවණතාවක් වර්තමානයේ පැවතීම නිසා මෙම ගැටලුව තවත් නරක අතට හැරී ඇත.[165] මෙම සීමාවන්ට පිළියම් වශයෙන් ගැටුම් පැවති ප්‍රදේශ තුළ ම වැඩසටහන් ඇති කළ යුතු අතර ප්‍රවාහන ගාස්තු සහනාධාර ලබා දිය යුතු ය. ජංගම සේවා සපයන්නන් ද යොදා ගත හැකි ය. බලපෑමට ලක් වූ ප්‍රජාවන් වෙත ළඟා වන අන්දමින් වැඩසටහන්

---

160 කොළඹ දී සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාව, 2016 ජනවාරි 17

161 ඔස්ට්‍රේලියානු මානව හිමිකම් මධ්‍යස්ථානය සහ ආසියානු ජාත්‍යන්තර යුක්තියට මුල පිරීම ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම්ව සිදුකරනු ලබන ප්‍රචණ්ඩත්වය සඳහා කාම්බොජයාවේ අතිවිශේෂ අධිකරණ ශාලාව විසින් වෙනසක් ඇති කළ හැකි ආකාරයේ හානි පූරණ ලබා දීම 11 (Australian Human Rights Centre and the Asian International Justice Initiative, Transformative Reparations for Sexual and Gender-Based Violence at the Extraordinary Chambers for the Courts of Cambodia 11) (2014 නොවැම්බර් 28), මෙතැනින් බලන්නඃ http://www.eastwestcenter.org/sites/default/files/filemanager/Research_Program/Politics_Governance_and_Security/AIJI/Reparations%20Workshop%20Report.pdf

162 එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි) පිටුව 14

163 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, සංක්‍රාන්තික යුක්තියට සම්බන්ධව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම්වූ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය ඉලක්ක කරගත් විශ්ලේෂණාත්මක අධ්‍යයනය (Analytical study focusing on gender-based and sexual violence in relation to transitional justice), A/HRC/27/21, (2014 ජුනි 30) පිටුව 14

164 Fionnuala, *ඉහත 104* සටහන පිටුව 112

165 නිම්මි ගෞරිනාදන් සහ කේට් ක්‍රොනින් ෆර්මන්, *ඉහත* 109 සටහන

සකස් විය යුතු ය.[166] නිදසුනක් ලෙස ප්‍රචාරණ ව්‍යාපාරයන් රටේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල දෙමළ බසින් පළ වන ප්‍රාදේශීය පුවත්පත්වල පළ කළ හැකි ය. අවසන් වශයෙන්, හානි පූරණ සඳහා සැකසුම් සහ අරමුදල් කලින් සැලසුම් කළ යුතු අතර, ඒවා නිශ්චිත විය යුතු ය. එමගින් නියෝග කරන ලද හානි පූරණ සැබැවින් ම ක්‍රියාවට නැංවීමට හැකි වන අතර, බලාපොරොත්තු ඉටු නොවීමෙන් වින්දිතයන්ට හානියක් ද සිදු නොවේ.[167]

### iii. සත්‍යය සොයා යාමේ ක්‍රියාවලිය සමග ඒකාබද්ධ වීම:

ඵලදායී හානි පූරණ වැඩසටහනක් සැලසුම් කිරීමට නම් එය සත්‍යය සොයා යාමේ ක්‍රියාවලිය සමග ඒකාබද්ධ වීම අවශ්‍ය වේ. හානි පූරණය සාර්ථක වීමට නම් විශ්වසනීය සත්‍යය සොයා යාමේ වැඩසටහනක් පැවතීම වැදගත් වේ.[168] අධිකරණයක දී සාක්ෂි දීමට කිසිදු ඉදිරිපත් නොවන වින්දිතයන් බහුතරයට සත්‍යය කොමිෂන් සභාවක් ඉදිරියේ සිය කතන්දරය කීමට හැකි වීම ම පුනරුත්ථාපනයේ වැදගත් කොටසකි.[169]

### වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරැකීම

සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ සවිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාවට නැංවිය යුතු ය. එසේ කිරීමේ දී සත්‍යය සොයා යාම, අධිකරණමය වගවීම, සහ හානි පූරණ වැඩසටහන් යන සංක්‍රාන්ති යුක්තියට අදාළ සියලු ම යාන්ත්‍රණ සිහි තබා ගත යුතු ය. ශ්‍රී ලංකාවේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හිංසනයට ලක් කළ, රඳවා තබා ගත්, අපචාරයට ලක් කළ, සහ පළා යාමට බල කරන ලද අවස්ථා ඇත.[170] ලිංගික ප්‍රචණ්ඩත්වයේ එක් අරමුණක් වන්නේ වින්දිතයන් බිය ගන්වා නිහඬ කරවීම බව වාර්තාවල සඳහන් වේ.[171] විදේශ රටවල සිටින වින්දිතයෝ සිය ඥාතීන්ට ඇමතීමට හෝ සම්මුඛ සාකච්ඡා ලබා දීමට බියක් දක්වති. වෛද්‍ය සේවයට සම්බන්ධ නිලධාරීන් සහ ප්‍රජාවේ සාමාජිකයෝ සාක්ෂිකරුවන් ලෙස කටයුතු කිරීමට පසුබට වෙති. මෙම ගැටලු නිසා සිදු වන්නේ අධිකරණයක නඩු පැවරීම සීමා වීම පමණක් නොවේ. සත්‍යය කොමිෂන් සභා සහ හානි පූරණ වැඩසටහන් ක්‍රියාත්මක වීමට නම් සාක්ෂිකරුවන් සුරැකීම ද සැළකිය යුතු තරමින් වැඩි දියුණු කළ යුතු ය.[172] පුනරුත්ථාපනය කරන ලද අපරාධකරුවන් සහ අධිකරණමය ක්‍රියාවලියට සහභාගි වන්නන් පමණක් නොව, හානි පූරණ ඉල්ලා පැමිණෙන සහ සත්‍යය කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන වින්දිතයන්

---

[166] Fionnuala, *ඉහත 104* සටහන පිටුව 137 (කොළොම්බියාවේ අසාර්ථක වූ හානි පූරණ වැඩසටහනක් පිළිබඳව සඳහන් කර ඇත. මෙහි දී හානි පූරණ පිළිබඳ ප්‍රචාරක දැන්වීම් එක් පුවත්පතක පමණක් පළ කර තිබූ අතර එය අවශ්‍ය ප්‍රදේශ කරා ළඟා වූයේ නැත.)

[167]ඔස්ට්‍රේලියානු මානව හිමිකම් මධ්‍යස්ථානය සහ ආසියානු ජාත්‍යන්තර යුක්තියට මුල පිරීම, *ඉහත 161 සටහන* 13 පිටුව

[168] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජූනි) පිටුව 9; Fionnuala, *ඉහත 104* සටහන පිටුව 126

[169] බිනයිෆර් නව්රොජී, අදෘශ්‍යමාන යුද අපරාධ දෘශ්‍යමාන කිරීම: සියෙරා ලියෝන් හි දූෂණ වින්දිතයන්ට පශ්චාත් ගැටුම් යුක්තිය ඉටු කිරීම (Making the Invisible War Crime Visible: Post–Conflict Justice for Sierra Leone's Rape Victims), 18 Harv. Hum Rts. J. 85 (2005) 103 ("සත්‍යය කොමිෂන් සභා මගින් වින්දිතයන් බොහෝ සංඛ්‍යාවකට තමන්ට එරෙහිව සිදු කරනු ලැබූ වැරදි පිළිබඳව වඩාත් සහනශීලී සහ සහයෝගී වටපිටාවක් තුළ යළි විස්තර කර කීමට අවස්ථාවක් ලබා දේ.")

[170] 170 ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදු කළ සම්මුඛ සාකච්ඡා, 2016 ජනවාරි සහ පෙබරවාරි

[171]*එහිම.*

[172]*එහිම.* පිටුව 30

සහ සාක්ෂිකරුවන් ද ආරක්ෂා වන පරිදි ජාතික අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ආරක්ෂණය සැලසුම් කළ යුතු ය.

**සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ ක්‍රියාත්මක කළ යුතු කාලය තීරණය කිරීම**

සත්‍යය සොයා යාමේ ක්‍රියාවලිය අවසන් වන තුරු හානි පූරණ ප්‍රමාද නොකළ යුතු ය. බොහෝ වින්දිතයන්ට ඇති හදිසි අවශ්‍යතා ඉක්මණින් ඉටු නොකළහොත් එය ප්‍රජාවට නිශේධනාත්මක ලෙස බලපානු ඇත. වින්දිතයන්ට බොහෝ විට සිය අත්දැකීම් බෙදා හදා ගැනීමට පෙර ඒ සඳහා යම් කාලයක් සහ පුනරුත්ථාපනයක් අවශ්‍ය වේ. "හානි පූරණයක් නොමැතිව, වගවීම සහ සත්‍යය දැන ගැනීමේ සමගාමී ක්‍රියාවලීන්ට සහභාගි වීමට බොහෝ වින්දිතයන්ට නොහැකි වනු ඇත."[173] කෙසේ වුව ද, සත්‍යය සොයා යාමේ ක්‍රියාවලිය ද ඉක්මණින් ඇරඹිය යුතු ය. ඵලදායී හානි පූරණ වැඩසටහනක් සැලසුම් කිරීම සහ එහි නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා ගැටුම පිළිබඳව මනා අවබෝධයක් තිබීම වැදගත් වේ.[174] විවිධ යාන්ත්‍රණ ගණනාවක් එකවර ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක විය හැකි වුව ද,[175] හානි පූරණ වැඩසටහන් සහ සත්‍යය සොයා යාමේ ක්‍රියාවලිය යන දෙකම තව දුරටත් ප්‍රමාද නොකර ඇරඹීම වැදගත් ය. එක් විසඳුමක් වන්නේ අවශ්‍ය අවස්ථාවල අතුරු හානි පූරණ ප්‍රදානය කිරීමට එක් සත්‍යය කොමිෂන් සභාවකට ඉඩ දීමයි. නිදසුනක් ලෙස, නැගෙනහිර ටිමෝරයේ "පිළිගැනීම, සත්‍යය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාව විසින් ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන් ඇතුළුව වඩාත් ම බලපෑමට ලක් වූවන් සඳහා අතුරු හානි පූරණ ප්‍රදානය කරන ලදී. වින්දිතයන්ට ඩොලර් 200ක ප්‍රදානයක් සහ සේවාවලට ප්‍රවේශවීමට ලැබුණු අතර ඔවුහු සුවපත් කිරීමේ (healing) වැඩමුළු සඳහා ද සහභාගි වූහ."[176] මෙවැනි වැඩසටහනක් මගින් ඒ ඒ පුද්ගලයාගේ අවශ්‍යතාවට ගැලපෙන මෙන් ම කාලීන හානි පූරණයක් ලබා දිය හැකි ය.

සත්‍යය සොයා යාමේ ක්‍රියාවලියකට සම්බන්ධ වී සිටි පමණින් වින්දිතයන් අධිකරණමය පිළියම්වලට හෝ පරිපාලනමය හානි පූරණවලට ප්‍රවේශ වීමෙන් නොවැළැක්විය යුතු ය. වින්දිතයන්ට සහ සමාජවලට ඉදිරියට යාමට හැකි වන්නේ සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණවල ඒකාබද්ධ සහ සාමූහික ප්‍රතිඵල හේතුවෙනි. බොහොමයක් වින්දිතයන්ට සෙසු ක්‍රියාවලීන්වලට සහභාගි වීමට අත්‍යවශ්‍ය වන මුල් පියවරක් වන්නේ හානි පූරණයෙන් හෝ සත්‍යය සොයා යාමෙන් ලැබෙන පුනරුත්ථාපනමය බලපෑමයි.[177] ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වී දිවි ගලවාගත්තවුන් ද සිහි තබාගෙන සැලසුම් කර ක්‍රියාත්මක කරන විසඳුම් ලබා දීම සඳහා ඇති විවිධාකාර යාන්ත්‍රණවලට ප්‍රවේශ වීමට වින්දිතයන්ට හැකි විය යුතු ය.

**☛ ප්‍රධාන නිර්දේශ**

---

[173] Fionnuala, *ඉහත 104* සටහන පිටුව 145

[174] එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම්වරයාට මාර්ගෝපදේශක සටහන- ගැටුම ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා හානි පූරණය (2014 ජුනි) 9 පිටුව

[175] නව්රොජ් (HRJ) පිටුව 39 ( සත්‍යය කොමිෂන් සභාවට සත්‍යය නිරාවරණය කර ගැනීමට නොහැකි වීමට ඉක්මන් අධිකරණමය ක්‍රියාවලියක මැදිහත්වීම මෙහිදී ඇති වන අභියෝගවලට ඇතුළත් වේ. කෙසේ වුව ද ඒකාබද්ධ වීමේ ප්‍රතිඵල "බොහෝ විට ධනාත්මක" වේ.)

[176] රුබියෝ-මැරින්, *ඉහත 15 සටහන*

[177] මානව හිමිකම් මධ්‍යස්ථානය කැලිෆෝනියා සරසවියේ බර්ක්ලි නීති විද්‍යාලය (Berkeley School of Law), වින්දිතයන්ගේ අධිකරණය, (2015), මෙතැනින් බලන්න https://www.law.berkeley.edu/wp-content/uploads/2015/04/VP_report_2015_final_full2.pdf

**රජය සහ පාර්ලිමේන්තුව සඳහා:**

- ජාත්‍යන්තර අපරාධ ඇතුළත් වන අයුරින් දේශීය නීති සංශෝධනය කිරීම, ඉහළ නිලධාරීන්ගේ වගකීම (command responsibility) ස්ථාපිත කිරීම සහ ස්ත්‍රී දූෂණයේ නිර්වචනයට පිරිමි වින්දිතයන්ව ද ඇතුළත් කිරීම.

- පොලීසියෙන් සහ නිලධාරීන්ගෙන් ස්වාධීනව වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත ක්‍රියාත්මක කිරීමට හැකි වන අයුරින් එම පනත සංශෝධනය කිරීම.

**රජය සඳහා:**

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී සම්මත වූ යෝජනාවෙහි සඳහන් විවිධ යාන්ත්‍රණයන් අප්‍රමාදව පිහිටුවීම.

- අධිකරණයට අදාළ පනතින් ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ අපරාධ ද ආවරණය වන බවට සහ ක්‍රියාපටිපාටි සහ සාක්ෂි සම්බන්ධ රීති මගින් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව නඩු පැවරීමට පහසුකම් සැලසීමට හැකි වන බවටත්, එම රීති වින්දිතයන්ට සංවේදී වන බවටත් වගබලා ගැනීම. යුද අපරාධ, මනුෂ්‍ය සංහතියට එරෙහිව සිදු කරනු ලබන අපරාධ සහ වධහිංසා සඳහා රටාවක් පෙන්වන සාක්ෂි පිළිගැනීමට ක්‍රියාපටිපාටි සහ සාක්ෂි සම්බන්ධ රීති මගින් ඉඩ දිය යුතු ය.

- එක් එක් සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණය සඳහා ජාතික අධිකාරිය, පොලීසිය, හමුදාව සහ රජයේ නිලධාරීන්ගෙන් ස්වාධීනව වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ප්‍රබල ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු ය.

- වත්මන් සහ පෙර පැවති සත්‍යය කොමිෂන් සභා, සිවිල් සමාජ සංවිධාන, ජාත්‍යන්තර ක්‍රියාකාරීන් සහ වින්දිතයන්ගේ නිර්දේශ ද ඇතුළත් වන හානි පූරණ ප්‍රතිපත්තියක් වැඩි දියුණු කර ක්‍රියාත්මක කළ යුතු ය.

- තනි පුද්ගලයන්ට හානි පූරණය කිරීම, සංකේතාත්මක හානි පූරණය සහ සාමූහික පිළියම් වැනි එකිනෙකට වෙනස් හානි පූරණ ක්‍රම හානි පූරණ ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම.

- ජීවනෝපාය අහිමි වීම, විවාහ වීමට ඇති අවස්ථාව අඩුවීම, සමාජයෙන් නෙරපනු ලැබීම, පාසල් අධ්‍යාපනයට බාධා වීම, මානසික ක්ෂතිය වැනි ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් වින්දිතයන්ට ඇති වූ ආර්ථිකමය බලපෑම් සඳහා වන්දි සහ හානි පූරණ ලබා දීම. අධිකරණය විසින් ගෙවීමට නියෝග කරනු ලබන වන්දි ගෙවීමට වැරදිකරුවන් බවට තීන්දු වූ අපරාධකරුවන් අපොහොසත් වන අවස්ථාවල දී එම වන්දි රජය විසින් ගෙවන බවට වග බලා ගැනීම.

- මනෝ-සමාජයීය සහය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, සහ රැකියා පුහුණුව ඇතුළු පුනරුත්ථාපනයක් ලබා දීම.

- ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කළ බව ප්‍රසිද්ධියේ පිළිගෙන වින්දිතයන්ගෙන් සාමූහික මට්ටමෙන් සමාව ඉල්ලීම. ප්‍රසිද්ධියේ පිළිගැනීමේ දී සහ සමාව ඉල්ලීමේ දී පිරිමි වින්දිතයන් ද ඇතුළත් කිරීමට, රහස්‍යභාවය රැකීමටට සහ සියලු ම වින්දිතයන්ට සංවේදී අයුරින් ඒවා සිදු කරන බවට වග බලා ගැනීම.

- නැවත සිදු නොවන බවට සහතික ලබා දීම. නැවත සිදු වීම වැළැක්වීම සඳහා අධිකරණමය වගවීම වැඩි දියුණු කිරීමට, ව්‍යවස්ථාදයකයේ සංශෝධන සිදු කිරීමට, සහ ආයතනික සහ

ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මීට ඇතුළත් විය යුතු ය.

- වින්දිත ප්‍රජාවට ම පොදුවේ ළඟා වන අයුරින් පුනරුත්ථාපනමය සහ සංකේතාත්මක හානි පූරණ සාමූහික වශයෙන් ලබා දීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම. නිදසුනක් ලෙස, කුසලතා පුහුණුව හෝ උපදේශන සේවාවන් ප්‍රජාවේ සියලු ම සාමාජිකයන්ට ලබා දිය හැකි ය.

- වින්දිතයන්ගේ මනෝ විද්‍යාත්මක, වෛද්‍ය, සහ ආර්ථිකමය හදිසි අවශ්‍යතා ඉටු කිරීම සඳහා අතුරු හානි පූරණ ලබා දීම. රජයේ ආයතන, දැනටමත් වින්දිතයන් සමග කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන, සහ සහය දීමට කැමති සෙසු කණ්ඩායම් විසින් ලබා දෙන හදිසි සේවාවන්ට පහසුකම් සැපයීම.

- හානි පූරණ වැඩසටහන්, අධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතු සහ සෙසු සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් සඳහා සහභාගි වන වින්දිතයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා වන බවට සහ ඔවුන්ට ආරක්ෂාව ලැබෙන බවට වග බලා ගැනීම. සහභාගි වීමේ දී රහස්‍යභාවය ආරක්ෂා වීම සම්බන්ධයෙන් ඇති සීමා සහ වෙනත් අවදානම් පිළිබඳව සියලු ම වින්දිතයන්ට සම්පූර්ණ තතු හෙළි කිරීම.

- හානි පූරණ වැඩසටහන්වල දී සහ සත්‍ය පැවසීමේ දී භාවිත වන සාධන සම්මතය අධිකරණයේ දී අපේක්ෂිත මට්ටමට වඩා පහළින් පවතින බවට වගබලා ගැනීම සහ වින්දිතයන්ගේ සංවේදීතාවට සහ රහස්‍යභාවයට ඉඩ දීම.

- සියලු ම යාන්ත්‍රණයන් තුළ සහ අදාළ වැඩසටහන්වල දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බවට වග බලාගන්න.

- විදේශ රටවල සිටින විශේෂඥයන්, වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ වීඩියෝ සම්බන්ධතා ඔස්සේ ලබා ගැනීමට ඉඩ දෙන රාමුවක් සැකසීම. විදේශ රටක සිට වීඩියෝ මගින් ලබා දෙන ප්‍රකාශවල රහස්‍යභාවය ආරක්ෂා විය යුතු අතර එම ප්‍රකාශ සුරක්ෂිත විය යුතු ය.

- දැනුවත් කිරීමේ ව්‍යාපාර හඳුන්වා දීම, නිලධාරීන් සහ සේවා සපයන්නන් පුහුණු කිරීම සහ වගවීමේ සහ හානි පූරණය කිරීමේ වැඩසටහන් ඇරඹීම ඇතුළු ක්‍රම මගින් ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වධහිංසාවට ලක් කිරීම වටා ඇති අපකීර්තියට පිළියම් කිරීමට පියවර ගැනීම.

**සිවිල් සමාජය සඳහා:**

- ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ සාක්ෂි එකතු කර සිතියම්ගත කර, එම සාක්ෂි ආරක්ෂා සහිත ආකාරයකට පවත්වාගෙන යාම.

- සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණයන් පිළිබඳව රජයට යෝජනා ඉදිරිපත් කිරීම. එහි දී, විශ්වසනීය සහ ස්වාධීන යාන්ත්‍රණ හඳුන්වා දෙන බවටත්, එම යාන්ත්‍රණ වින්දිත කේන්ද්‍රීය වන බවටත් වගබලා ගන්නා ලෙසට යෝජනා ඉදිරිපත් කිරීම.

- හැකි අවස්ථාවල වින්දිතයන්ට පුනරුත්ථාපනමය සහ වෙනත් සේවාවන් ලබා දීම. අධිකරණමය වගවීමක් ලබා ගැනීම දක්වා යාමට කැමති වින්දිතයන්ට සහය වීම සහ එම ක්‍රියාවලිය සහ එහි ඇති අවදානම් පිළිබඳව ඔවුන්ට සම්පූර්ණ අවබෝධයක් ලබා දීමට වගබලා ගැනීම.

- ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වධහිංසාවට ලක් කිරීම වටා ඇති අපකීර්තියට පිළියම් කිරීම සඳහා රජය සමග එක්ව කටයුතු කිරීම.

**ජාත්‍යන්තර ප්‍රජාව සඳහාඃ**

- දී ඇති විවිධ පොරොන්දු ඉටු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ දැනුම සහ සම්පත් ලබා දීම මගින් වත්මන් සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකාවට සහය වීම.
- ශ්‍රී ලංකාවේ වින්දිතයන් සමග හෝ ඔවුන් වෙනුවෙන් කටයුතු කරන සංවිධානවලට මූල්‍ය සහ සෙසු සහය ලබා දීම.

සමාප්තිය

ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණයන් සහ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා බොහෝ සෙයින් සිදු වෙමින් පවතී. ලිංගික ප්‍රචණ්ඩත්වය සිදු කර ඇත්තේ යම් පිළිවෙලකට අනුව බව වාර්තා මගින් දැන් පෙනී යයි. මානසික සහ ශාරීරික හානි, ආර්ථික වශයෙන් කොන් වීම, සහ ප්‍රජාව සහ පවුලේ සාමාජිකයන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම තුළින් මෙම ප්‍රචණ්ඩත්වය වින්දිතයන්ට බරපතළ ලෙස බලපායි. වින්දිතයන්ගේ පවුල්වල අයට ද මානසික, ආර්ථික සහ සමාජ හානිවලින් පීඩා විඳීමට සිදු වේ. ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි පවුල් සබඳතා බිඳී යාම, ප්‍රචණ්ඩත්වය තවත් ඉහළ යාම සහ සමාජ ප්‍රශ්න වැනි ගැටලු ප්‍රජාවට ද පොදුවේ බලපායි.

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණයට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන්ට අවශ්‍ය විසඳුම් ලබා දීම සඳහා ප්‍රවේශමෙන් සකස් කරන ලද අධිකරණමය සහ පරිපාලනමය හානි පූරණයන් ලබා දිය යුතු ය. වින්දිතයන්ට සංවේදී වන සහ රහස්‍යභාවය ආරක්ෂා වන ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලීන් ස්ථාපිත කළ යුතු අතර, සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂා කිරීමේ ප්‍රබල ක්‍රම ක්‍රියාත්මක කළ යුතු ය. තනි පුද්ගල, සාමූහික සහ සංකේතාත්මක යනුවෙන් පුළුල් පරාසයක පැතිරුණු හානි පූරණ අවශ්‍ය වේ. ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය විධිමත් ලෙස සිදු කිරීම සහ යුද අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරනු ලබන අපරාධ සහ වධහිංසා ලෙස දැන් ජාත්‍යන්තරව පිළිගෙන තිබේ. මෙම ප්‍රමිතීන් දේශීය නීතියට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පියවර මෙන් ම, වගවීම ඉටු කරවා ගැනීම සහ දඬුවම් ලබා නොදීමේ සංස්කෘතියට පිළියමක් ලැබෙන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ශ්‍රී ලංකාව විසින් ගත යුතු ය. සත්‍යය, යුක්තිය, හානි පූරණය සහ නැවත සිදු නොවීම සංක්‍රාන්ති යුක්තියට අයත් වේ. මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ සහ ප්‍රතිසංස්කරණ ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා රජය පොරොන්දු වී ඇති අතර එම පොරොන්දු ඉටු කිරීම දිගට ම සිදු කළ යුතු ය. තව දුරටත් ප්‍රමාද නොවිය යුතු ය. අතීතයේ සිදු වූ දේ පිළිබඳව සැලකිල්ලෙන් මෙනෙහි කොට සාමය සහ ප්‍රතිසන්ධානය සිදුවන බවට සහතික කිරීමේ වැදගත් පියවර ගැනීමට ශ්‍රී ලංකාවට දැන් කාලය උදා වී ඇත.